# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,996 — 1964 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද — 1964.3.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 377 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 388 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... ... | 400 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම් ... ... | 414 | වෙන්දේසි කිරීම පිළිබඳ දන්වීම් ... ... | 415 |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 415 | විවිධ දන්වීම් ... ... ... | 415 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාප්ය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත්, ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණ යකින් සමත් වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම්

අංකය : ඒ. 56/එක්ස්. 1470/64.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පේරාදෙණියේ හා කුණ්ඩසාලේ කෘෂිකර්ම පාසැල්හි කථිකාචාර්ය, තනතුරු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පේරාදෙණියේ හා කුණ්ඩසාලේ කෘෂිකර්ම පාසල්හි කථිකාචාර්ය තනතුරු :

(අ) සිංහල මාධ්‍යය (තනතුරු 1 යි)
(ආ) දෙමළ මාධ්‍යය (තනතුරු 1 යි)

සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට අයදුම් පත්‍ර 1964.4.10
(ආ) විදේශීය අයදුම් පත්‍ර 1964.4.17

**සටහන් :—**

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවියහැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට—පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මේ තනතුරු විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරු ය. මුල් අවස්ථාවේදී පත්වීම් ලබා අවුරුදු තුනක් ගතවන තුරු ආධුනික තත්ත්වයේ සිටිය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—මේ තනතුරුවලට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය. වර්ෂයකට රුපියල් 5,160 න් පටන්ගෙන රු. 360 වැටුප් වර්ධකයන් 9 කින් රු. 8,400 දක්වා නගී.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1964.4.10 වේනි දිනට අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 35 නොඉක්මවා ඇති බවට ; (දැනට රජයේ ස්ථිර තනතුරු දරන්නන්ගෙන් වයස සීමාව නොසලකා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.)

(ඇ) කෘෂිකර්මය, පශු වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව හෝ කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව සම්බන්ධයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලත් අයෙකු බව.

**සටහන :**—ගෞරව සහිත උපාධියක් ලත් සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) සිංහල/දෙමළ භාෂාවෙන් දේශන පැවැත්වීමට හැකියාවක් තිබිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ භෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල/දෙමළ විෂයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂිකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතුයයි නිර්දේශ නොකරතහොත් සලකා බලනු නොලැබේ.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුළත තම අයදුම්පත ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වේ නම් වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍ර සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500,
ගාලු මුවදොර මහාලේකම් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1964 මාර්තු මස 21 වැනිදා.

3–1040/2—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය

**සහකාර කාර්ය සම්පාදක තනතුර**

රුපියල් 8,880—480 හා 600—රු. 16,200 යන වැටුප් පරිමාණය හිමි ඉහත සඳහන් තනතුර සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම්—

(i) අයැදුම්කරුවන් වයස අවුරුදු 30ට වැඩි ලංකා පුරවැසියන් විය යුතුය.

(ii) අයැදුම්කරුවන් අධිනීතිඥයන් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධි ලබාගත් අය විය යුතුය.

(iii) අයැදුම්කරුවන් සිංහල විෂයයෙහි ප්‍රවීණයන් විය යුතුය.

3. අයැදුම්කරුවන්, පිළිබඳ සම්පූර්ණ විස්තරද, වගවිභාගදිය සඳහා අයැදුම්කරුවන් සම්බන්ධයෙන් කරුණු කියා පෑමට කැමති තීරකයන් දෙදෙනෙකුගේ නම්ද ඇතුළත් කොට, 1964.4.27 දිනදී හෝ ඊට ප්‍රථමයෙන් හෝ මෙහි පහත අත්සන් කර ඇති නිලධාරියාට ලැබෙන සේ අයැදුම්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. මේ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුත්තේ සහතික පත්‍ර ආදියෙහි පිටපත් පමණකි (මුල් ලියවිලි නොවේ).

බී. කොස්වත්ත,
සෙනෙට් සභා කාර්ය සම්පාදක.

1964 මාර්තු මස 18 වනි දින,
කොළඹ දීය.

3–966—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරී තනතුරු

ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරී තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් දීමනාවන් හා සේවය පිළිබඳ කොන්දේසි.**—මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 1,980 න් පටන් ගෙන වර්ෂයකට රු. 120 සහ 180 බැගින් වැඩිවී රු. 4,620 තෙක් නගී. රජයේ රෙගුලාසි අනුව ජීවන වියදම් හා ගෙවල් කුලී ගෙවනු ඇත.

3. **අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—අයදුම්කරුවෝ වයස අවුරුදු 25ටත් 35ටත් අතර ලාංකිකයන් විය යුත්තාහ.

අයදුම්කරුවෝ :—

(1) (අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සාමාර්ථය ලැබ පහත සඳහන් සුදුසුකම් වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඇත්තවුන් විය යුතුයි.

(ආ) (i) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව බිම් මැනීම් සහ මට්ටම් පිළිබඳව සර්වේයර් ජනරාල්ගේ අවසර පත්‍රය,

(ii) පහත සඳහන් එකක් ඇතුළුවූ ලංකා කාර්මික විද්‍යාලයේ අනුමත කරන ලද පාඨමාලාවක් අයදුම්කරු සම්පූර්ණ කරන ලද බවට සහතිකය.

(අ) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව ගොඩනැගිලි තැනීම i සහ ii හා මට්ටම් ගැනීම i සහ ii.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව නාගරික හෝ ගොඩ නැංවීම් ඉන්ජිනේරු සහතිකය.

(iii) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳ අවුරුදු 5ක පළපුරුද්දක් ඇතිව ප්‍ර. වැ. දෙ. උප පරීක්ෂක ශ්‍රේණියට පත්වීමේ දෙපාර්තමේන්තුව විභාගයෙන් සාමාර්ථය හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථය.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—මෙම පත්වීම අවුරුදු 3ක පරීක්ෂණාත්මක කාලයකට යටත් ය.

(අ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් තනතුරු වලට පත්කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ මෝටර් වාහන සපයා ගත යුත්තාහ. රජයේ මුදල් රෙගුලාසි අනුව ඔවුන්ට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(ඇ) තෝරා ගනු ලැබූ අයදුම්කරුවෝ රු. 2,000 ක ඇපයක් තැබීමට සූදානම් විය යුත්තාහ.

(ඈ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දැනට පනවා ඇති නීති හා මින් මතු පනවන නීති වලටද විශේෂයෙන් 1956 අංක 33 දරණ රජයේ භාෂා පණතේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ නීති වලටද තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් බැඳී සිටිය යුතුවේ.

5. තම චරිතය පිළිබඳව මෑතදී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

6. මෙයට යාකර ඇති නියමිත පෝරමය අනුව පිළියෙල කරගන්නා ලද අයදුම් පත් 1964 අප්‍රේල් මස 10 වැනි දිනට හෝ ඊට පෙර හෝ "ඉඩම් කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ" යන ලිපිනයට එවිය යුතුය.

7. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ මුල පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් වලට අදාළ වූද පොදු කොන්දේසි බලන ලෙස ඉල්ලුම් කෙරේ.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

1964 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දීය.

### ආකෘති පත්‍රය

#### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරී තනතුරු

1. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.
2. උපන් දිනය හා උපන් ස්ථානය :————.
   (අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතිකයෙන් පිටපතක් සමග) :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
3. අධ්‍යාපනික සුදුසුකම් (සමර්ථවූ දින සහිතව) :————.
4. පාසැලින් අස්වූ දින සිට කරන ලද රක්ෂාවල් පිළිබඳ සම්පූර්ණ විස්තර සහ දැනට ලැබෙන වේතනය සහ වැටුප් ක්‍රමය :————.
5. ගොඩනැගිලි ඉදිකිරීමේ පළපුරුද්ද :————.
6. යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.
7. අමුණා ඇති සහතිකවල ගණන :————.
8. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමක් ඇත්තවුන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඔවුන්ගේ තනතුරත් :————.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම්කරු ලංකාවෙහි ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) හා (ඈ) දෙකම හෝ පිරිවිය යුතුයි. අයදුම්කරු ලංකාවෙහි නොඉපදුනි නම් (අ), (ආ), හෝ (ඇ) හෝ (ඈ) හා (ඇ) දෙකම පිරිවිය යුතුය.

3–833—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ඇබෑර්තු

### ජාතික පේෂකර්ම සංස්ථාව

එෂී 1964 අප්‍රේල් මස 10 වෙනි දින පස්වරු 4.30 දක්වා ටර්බයින් යන්ත්‍රා ක්‍රියා කරවන්නා තනතුරු සඳහා අයදුම්පත් භාරගනු ලැබේ.

අඩුම සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ සහතිකය ඇත්තන් විශේෂයෙන් සලකනු ලැබේ.

(ආ) අධික බලවේගයක් ඇති බොයිලේරු සඳහා පළමුවෙනි ශ්‍රේණියේ බොයිලේරු සේවකයෙකුගේ සහතිකයක්.

(ඇ) අධික බලවේග බොයිලේරු සේවකයෙකු හැටියට හෝ ටර්බයින් සේවකයෙකු හැටියට අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක්.

(ඈ) වැඩ කිරීමට සෑහෙන ඉංග්‍රීසි දැනුමක්.

(ඉ) ටර්බයින් යන්ත්‍රා ක්‍රියා කිරීමේ පළපුරුද්දක් ඇත්නම් එය අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

වැටුප් :

සියළු දීමනා ඇතුළුව මසකට රු. 210—රු. 6×15—රු. 300.

අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම්ද, පාසැලින් අස්වූ පසු කළ රැකියාවන් සම්බන්ධ සම්පූර්ණ විස්තරද, අයදුම්කරුවන් විසින් සඳහන් කළ යුතු අතර, සහතිකයන්හි පිටපත්ද, (මුල් පිටපත් නොව), ඉදිරිපත් කළ යුතුය.

ආධාර ලබාගැනීමට හෝ අසත්‍ය තොරතුරු සැපයීමට හෝ තැත් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

ලේකම්.

ජාතික පේෂකර්ම සංස්ථාව,
32ඒ, බාන්ස් පෙදෙස,
කොළඹ 7.

3–867—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

අංකය : ශිෂ්‍ය/312.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### හංගේරියානු රජය විසින් පිරිනමන ශිෂ්‍යත්ව, 1964

පහත සඳහන් විෂයයන් අතරින් ප්‍රථම උපාධි මට්ටමේ අධ්‍යයනය සඳහා හංගේරියානු රජය විසින් පිරිනමන ශිෂ්‍යත්ව දෙකක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

(අ) සිවිල් ඉංජිනේරු ශිල්පය.

(ආ) විදුලිය ඉංජිනේරු ශිල්පය.

(ඉ) ගෘහ නිර්මාන ශිල්පය.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—පහත සඳහන් අයගෙන් අයදුම් පත් භාරගනු නොලැබේ :—

(අ) රජයේ සේවකයන්.

(ආ) මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හෝ රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්.

(ඉ) දැනටමත් ලංකාවේ විශ්ව විද්‍යාලයයක පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයන්.

**සංලක්ෂය 2.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණ ය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මුල් අවස්ථා වේදී 1964.9.1 සිට වර්ෂයක් සඳහා වන අතර, දීර්ඝ කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ හංගේරියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතු සි.

(ආ) 1964.9.1 වැනි දිනට, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුයි.

(ඉ) පහත සඳහන් සාමාර්ථයන් ද ඇතුළුව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් 6 කින්, දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සමත් වී සිටිය යුතුයි :—

(i) අයදුම්කරන්නේ ඉංජිනේරු ශිල්පය සඳහා නම්—

| | |
|---|---|
| ශුද්ධ ගණිතය<br>ව්‍යවහාරික ගණිතය<br>උසස් ගණිතය | මින් එකක් සඳහා සම්මාන සාමාර්ථයක් |

භෞතික විද්‍යාව—සම්මාන සාමාර්ථය

රසායන විද්‍යාව—සම්මාන සාමාර්ථය

ඉංග්‍රීසි භාෂාව—සාමාන්‍ය සාමාර්ථය.

සිංහල හෝ දෙමළ භාෂාව—සාමාන්‍ය සාමාර්ථය

(ii) අයදුම් කරන්නේ ගෘහ නිර්මාන ශිල්පය සඳහා නම්—

| | |
|---|---|
| ශුද්ධ ගණිතය<br>ව්‍යවහාරික ගණිතය<br>උසස් ගණිතය | මින් එකක් සඳහා සම්මාන සාමාර්ථයක් |

භෞතික විද්‍යාව—සම්මාන සාමාර්ථය

ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම—සම්මාන සාමාර්ථය

ඉංග්‍රීසි භාෂාව—සාමාන්‍ය සාමාර්ථය

සිංහල හෝ දෙමළ භාෂාව—සාමාන්‍ය සාමාර්ථය

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ගමන් වියදම්

(ආ) හංගේරියාවේ නතරව සිටීමේ වියදම්

(ඉ) අධ්‍යයන පහසුකම්.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමුන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම්ව සිටිය යුතුය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් හංගේරියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත් රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රධාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් හංගේරියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට, රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු ශිෂ්‍යත්වධාරීන්ට රක්ෂා ලබා දීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයකු ශිෂ්‍යත්ව ප්‍රදානය ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස අනාසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකරන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1964.4.11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 3, "සිරිමතිපායේ", අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1964 මාර්තු මස 18 වැනිදා,
කොළඹ 3, "සිරිමතිපායේ"
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

## රාජකීය ලංකා නාවික හමුදාව

**සහකාර වැඩ මූලික (මෝටර් ප්‍රවාහණ) තනතුර**

රාජකීය ලංකා නාවික හමුදාවේ සහකාර වැඩ මූලික (මෝටර් ප්‍රවාහණ) තනතුරු එකක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප්.**—මෙම තනතුරට අදාළ වැටුප් ක්‍රමය වසරකට රු. 1,860—120—රු. 3,780 කි.

පළපුරුද්ද සහ සුදුසුකම් අනුව කිසියම් අනුග්‍රහයක් දිය යුතු නම් භාණ්ඩාගාරය හා සාකච්ඡා කොට තෝරා ගත් අයදුම් කරු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු ස්ථානයක පිහිටුවනවා ඇත.

3. **සේවා කොන්දේසි :**

(1) තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත එකකි. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ. තෝරා ගත් අයදුම්කරු අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලැබේ;

(2) තෝරා ගත් අයදුම්කරු දැනුම් දුන් ඇසිල්ලකින් රාජකාරි බාර ගත යුතුවාක් මෙන්ම, ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ද සූදානම්ව සිටිය යුතුය. දැනට කොළඹ, ත්‍රිකුණාමලය, වැලිසර සහ කුරෙයිනගර් යන ස්ථානයන්හි නාවික හමුදා ආයතනයන් පිහිටුවා තිබේ.

4. **අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද :**

සෑම අයදුම් කරුවකු විසින්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයක සාමාර්ථය ;

(ආ) පිළිගත් ඉංජිනේරු සමාගමක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ආධුනික කාලයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටීම සහ යටත් පිරිසෙයින් අවුරුදු දෙකක් තුළ වත් පරිපාලන ධුරයක් දරමින් සේවය කර සිටීම ;

(ඉ) පෙට්‍රල් හා ඩීසල් එන්ජින් වලින් බලගැන්වෙන මෝටර් වාහන ක්‍රියා කරවීම, අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ යටත් පිරිසෙයින් තුන් අවුරුද්දක පළපුරුද්දක් තිබීම ;

(ඊ) මෝටර් වාහන අළුත්වැඩියා කරන විශාල කම්හලක් සංවිධානය කිරීමේ හසල බුද්ධියද, වාහන අළුත් වැඩියා කිරීම හා සම්බන්ධ සියලු ද්විතීය කටයුතු විෂයෙහි මෙන්ම අතිශය නවීන්තම අත්හදාබැලීම් උපකරණ භාවිතයෙහි නිපුණත්වයද තිබිය යුතුය.

5. **අවශ්‍ය වෙනත් සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් ද ලබා ඇති බවට සෑම අයදුම් කරුවකු විසින් ම සාක්ෂි සැපයිය යුතු ය :—

(අ) 1964 අප්‍රේල් 1 වෙනිදාට වයස 25ට නො අඩු හා 35 නො වැඩිවීම ;

(ආ) යහපත් චරිතයකින් සහ හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් සමන්විත වීම.

6. ලංකාවේ පිහිටි එක්සත් රාජධානි කඳවුරු ආපසු ලංකාවට පවරා ගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුව ගත් තීරණය හේතුකොට ගෙන ලංකාවේ එක්සත් රාජධානි සේවාවන්හි නියුක්තව සිටි 1956 ජූලි 6 වෙනි දා හෝ ඊට පසු දිනක අස් කරනු ලැබූ හෝ මතු අස් කරනු ලබන නාවූ හෝ සිවිල් සේවකයන් වෙනුවෙන් පහත සඳහන් පහසුකම් සලසා තිබේ :—

(i) **වයස.**—නියම කරන ලද උපරිම වයස් සීමාව නො ඉක්මවා සිටින සේ ඔවුන්ගේ වයසෙන් එක්සත් රාජධානි හමුදා සේවා කාලය අඩු කිරීම ;

(ii) **අධ්‍යාපනික සුදුසුකම්.**—අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම 7 වෙනි ප්‍රමාණය වේ ;

(iii) **ආධුනික කාලය සහ පළපුරුද්ද.**—ආධුනික කාලයක් අවශ්‍ය නැත. එහෙත් ඊටත් සරිලන සේ පළපුරුදු කාලය ආධුනික කාලයේ ප්‍රමාණයෙන් දීර්ඝ විය යුතුය.

7. අයදුම් කරුවන් විසින් ඉල්ලුම් පත්වලට පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ඇමිනිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා රෙගුලාසි සඳහා නිකුත් කරනු ලබන සහතික බාර ගනු නොලැබේ.) ;

(ආ) ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඇ) ලබා ඇති පළපුරුද්ද පිළිබඳ සහතික ;

(ඈ) ලඟ දී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් චරිත සහතිකය සැපයීම අවශ්‍ය නොවේ).

8. මෙම ගැසට් පත්‍රිකාවේ I වෙනි කොටසෙහි දෙවැනි කාණ්ඩයේ ප්‍රසිද්ධ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාළ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

9. කලින් ලත් පළපුරුද්ද සහ යෙදී සිටි රක්ෂාවල් ද පිළිබඳ විස්තර දක්වමින් ලිපියක් මගින් කොළඹ, තැ. පෙ. 593, නාවික හමුදාපතිට ලියා ඉල්ලුම් කළ යුතුය. ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ "සහකාර පෝර්මන් (මෝටර් ප්‍රවාහන) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් ලියා 1964 අප්‍රේල් 20 වෙනි දින හෝ ඊට පෙර නාවික හමුදාපති ට ලැබෙන සේ එවිය යුතුය.

එ. රෙ. සමරසේකර,
සිවිල් පාලන නිලධාරි සහ ගණකාධිකාරි,
රාජකීය ලංකා නාවික හමුදාව.

64.3.18,
කොළඹ.

3–958—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**ලංකා ගුවන් විදුලි ප්‍රාචීන වාදක මණ්ඩලය—වයලීන වාදක තනතුර**

ලංකා ගුවන් විදුලි දෙමළ වාදක මණ්ඩලයෙහි වයලීන වාදක තනතුරක් සඳහා පළපුරුදු සංගීත භාණ්ඩ වාදකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ශිල්පීන් තෝරාගැනීමේ පරීක්ෂණයකින් අසමත් වූ හෝ ලංකා ගුවන් විදුලි ශිල්පියෙකු වශයෙන් "බී" ශ්‍රේණියට පහලින් වගී වූ සංගීතඥයින් විසින් මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ යුතු නොවේ. වාදක මණ්ඩලයේ දැනට සිටින සාමාජිකයින්ට මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකිය.

3. ඉල්ලුම්කරුවෝ උතුරු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතය පිළිබඳ විශේෂ දක්ෂකම් ඇති, සරල සංගීතය වාදනය කිරීමට ද හැකියාවක් ඇති අය විය යුත්තාහ. ඔවුන් ඉන්දියානු තාල හා රාග පිළිබඳ මනා දැනුමක් ලබා සිටිය යුතු අතර, ඒවා ලිවීමේත් කියවීමේත් හැකියාවක් ඇතියවුන් විය යුතුය. වාදක භාණ්ඩවලින් එකක් ගැන විශේෂ දැනුමක් ඔවුන් සතු විය යුතුයි. වාදන භාණ්ඩ කිහිපයක් වාදනය කිරීමට හැකියාවක් ඇත්නම් එය වැඩි සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. පිළිගත් ඉන්දියානු සංගීත ආයතනවලින් සහතික ලත් ඉල්ලුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. නියමිත තූර්ය භාණ්ඩයම හැර තමන්ට වාදනය කළ හැකි වෙනත් භාණ්ඩද අවශ්‍ය වූ විටක වාදක මණ්ඩලයේ නායකයාගේ අණ පරිදි වාදනය කළ යුතු වේ.

4. පත්වීම් දෙනු ලබන්නේ ප්‍රථමයෙන් අවුරුදු දෙකක් (2) කොන්ත්‍රාත්තුවකටය. පසුව, පත්වීමේ කොන්දේසි අනුව කොන්ත්‍රාත්තුව විටින් විට දීර්ඝ කිරීමට ඉඩ තිබේ. නියමිත මාසික දීමනාවට අමතරව කිසිදු ගෙවීමක් කරනු නොලැබේ. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලින් ඉඩකඩ සලසා තිබෙන අන්දමට අමතරව දෙපසේ කවරකුට වුවද ලියවිල්ලකින් මසක කල්දීමකින් පසු සේවය නිම කළ හැකියි. වාදක මණ්ඩලයේ සාමාජිකයෝ සතියකට පැය 48 ක් වනසේ වැඩ කළ යුතුය. සේවා කොන්දේසි පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයට පැමිණ ලබා ගත හැක.

5. ගෙවනු ලබන මුදල රු. 200 ත් රු. 300 ත් අතර වේ.

වැඩි සුදුසුකම් හා පළපුරුද්දකම් ඇති අයදුම්කරුවන්ට යථෝක්ත වැටුප් ක්‍රමය තුළ නිසි පාදයක වේතනයක් ගෙවනු ඇත.

6. අයදුම්කරුවන් ලාංකික පුරවැසියක් දැයි සඳහන් කර එම ප්‍රකාශයන් සනාථ කිරීම පිණිස උප්පැන්න සහතික පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.

7. ඉල්ලුම් පත්, 1964.4.10 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලංකා ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල්, කොළඹ 7 යන ලිපිනයට එවිය යුතුයි.

එස්. බී. සේනානායක,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1964 මාර්තු මස 18 වැනි දින.

3–960—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය.

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### ගුවන් විදුලි වාර්තාකරු තනතුර

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි වාර්තාකරු තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. මෙම දැන්වීමේ අග දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1964 අප්‍රියෙල් මස 10 වැනි දින නොඉක්මවා ලියාපදිංචි කළ තැපෑලෙන් "කොළඹ 7, ලංකා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්" වෙත එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "ගුවන් විදුලි වාර්තාකරු" යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,700—10×120—6×180 හා රු. 4,980 කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. ආරම්භයෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකටය.

4. **අවශ්‍ය සුදුසුකම් :**

(i) සෑම අයදුම්කරුවෙකුම යට දැක්වෙන කරුණු ඔප්පු කෙරෙන සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි:—

(අ) 1964 අප්‍රියෙල් මස 10 වැනි දිනට වයසින් අවුරුදු 21 ට නොඅඩු හා 45 ට නොවැඩි බව. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.) ;

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇති බව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලත් ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ පස් වසරක පළපුරුද්දක් ඇති ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් අනිවාර්ය නොවේ ;

(ඇ) මනා චරිතයකින් ද කායික සෞඛ්‍යයෙන් ද යුක්ත බව.

(ii) ගුවන් විදුලි වාර්තාකරුවන්ගේ රාජකාරි කටයුතු සිංහලෙන් කිරීමට ඇති හැකියාව අවශ්‍ය සුදුසුකමක් ලෙස සලකන අතර අයදුම්කරුවන්ට මෙම රාජකාරී කටයුතු ඉංග්‍රීසියෙන් හා/හෝ දෙමළෙන් ද කිරීමට හැකියාව තිබිය යුතුයි. ස්වදේශීය හා ජාත්‍යන්තර වර්තමාන සිදුවීම් පිළිබඳ මනා දැනීමක් ඔවුන්ට තිබිය යුතුයි. ලේඛන කලාව හා/හෝ ගුවන් විදුලි කටයුතු පිළිබඳ පළපුරුද්ද බොහෝ සේ ප්‍රයෝජනවත් වනු ඇත.

5. යට දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්වලට අමුනා එවිය යුතුයි:—

(1) උප්පැන්න සහතික පත්‍රය (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථාව සංග්‍රහය යටතේ නිකුත් කළ උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.) ;

(2) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය ;

(3) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ මෙම තනතුරට යෝග්‍ය බව සඳහන් මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මෙම උප ශීර්ෂය යටතේ නියමිත ලියවිලි අනවශ්‍යය.)

**සැළකිය යුතුයි.**—මෙකී සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් එවන ඉල්ලුම් පත්, නියමිත දිනය ඉක්මවා ලැබුණහොත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එය ලැබී ඇත්තේ නියමිත කාලසීමාව තුළ නම් හෝ ප්‍රමාදයට ඒත්තු වන හේතු දක්වන්නේ නම් මිස ඒ පිළිගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත මිස දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම හා අදාල පොදු කොන්දේසි බලන්න.

එස්. බී. සේනානායක,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1964 මාර්තු මස 26 දින,
කොළඹ 7.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

#### ගුවන් විදුලි වාර්තාකරු තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
 (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
 (ආ) සෙසු නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. (අ) 1964 අප්‍රියෙල් 10 වැනි දිනට නියම වයස :— අවුරුදු :——, මාස :——, දින :——.
 (ආ) උපන් දිනය (උප්පැන්න සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.
4. ජාතිය :—
 (1) ලාංකිකත්වය ලියා පදිංචි කිරීමෙන් ද, පෙළපතින් ද යන වග :————.
 (2) ලාංකිකත්වය පෙළපතින් නම් යට දැක්වෙන අය උපන් තැන දන්වන්න :—.
  (අ) අයදුම්කරු :————.
  (ආ) අයදුම්කරුගේ පියා :————.
  (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
  (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
5. අධ්‍යාපනික සුදුසුකම් (මීට සාධක වශයෙන් අමුනා ඇති ලියවිලි මොනවාද ?) :————.
6. ගුවන් විදුලි ප්‍රචාර කටයුතු හා ලේඛන කටයුතු සම්බන්ධයෙන් ඇති පළපුරුද්ද හා සේවා කාලය :————.
7. අමුනා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.
8. සේවා මුක්ත හටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග :————.
 (එසේ නම් සේවයෙන් අස්වී යෑමේ සහතිකය හෝ වෙනත් යම් සාක්ෂි හෝ අමුණා එවිය යුතුයි.)
9. රජය යටතේ කිසි විටෙක සේවය කර ඇත්නම් ඒ කවදාද කොතැනකද යන්න :————.
 (එක් එක් දෙපාර්තමේන්තුවේ කළ සේවා කාලය දන්විය යුතුයි.)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1022—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### වැඩ සටහන් සහායක තනතුර (ඉංග්‍රීසි)

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සහායක (ඉංග්‍රීසි) තනතුරක් සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. මෙම දැන්වීමේ අග දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත්, 1964 අප්‍රියෙල් මස 10 වැනි දින නොඉක්මවා ලැබෙන සේ කොළඹ 7, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "වැඩ සටහන් සහායක" යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,820—9×120, 8×180 හා 4×240—රු. 6,300 කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ආරම්භයෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් වසක ආධුනික කාලයකටය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම යට දැක්වෙන කරුණු ඔප්පු කෙරෙන සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි:—

(අ) 1964 අප්‍රියෙල් 10 වැනි දිනට වයසින් අවුරුදු 21ට නොඅඩු හා 45ට නොවැඩි බව. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.) ;

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු හෝ/ගුවන් විදුලි සේවය සඳහා විශේෂ වටිනාකමක් ඇති නාට්‍ය, සංගීතය, හෝ කථනය පිළිබඳ වෘත්තීය උපාධියක් හෝ ඩිප්ලෝමා උපාධියක් හෝ සහතිකයක් හෝ ඇති බව: (ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලැබූ ගුවන් විදුලි සේවා පිළිබඳව පස් අවුරුද්දක පළපුරුද්දක් ඇති ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි කටයුතු පිළිබඳ නිරතව සිටින සේවකයන්ගෙන් මෙම සුදුසුකම් ඉල්ලා සිටිනු නොලැබේ.) ;

(ඇ) මනා චරිතයකින් ද කායික සෞඛ්‍යයකින් ද යුක්ත බව.

5. යට දැක්වෙන ලියවිලි වල පිටපත් (මුල් ලියවිලි නොවේ.) ඉල්ලුම්පත් වලට අමුනා එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතික පත්‍රය (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කල උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.) ;

(2) ඉහළම අධ්‍යාපනික සුදුසුකම දැක්වෙන සහතිකය සහ/හෝ වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික ;

(3) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ මෙම තනතුරට යෝග්‍ය බව සඳහන් මෑතකදී ලබාගත් සහතික පත් දෙකක්. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන්. මෙම උප ශීර්ෂය යටතේ නියමිත ලියවිලි අනවශ්‍යය.)

**සැළකිය යුතුයි.**—මෙකී සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් එවන ඉල්ලුම්පත්, නියමිත දිනය ඉක්මවා ලැබුනහොත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එය ලැබී ඇත්තේ නියමිත කාලසීමාව තුළ නම් හා ප්‍රමාද යට ඒත්තු වන හේතු දක්වන්නේ නම් මිස එය පිළිගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ ගුවන් විදුලි සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත මිස දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම හා අදාළ පොදු කොන්දේසි බලන්න.

9. ඉල්ලුම් පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

එස්. බී. සේනානායක,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1964 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 7.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**වැඩ සටහන් සහායක (ඉංග්‍රීසි) තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. (අ) 1964 අප්‍රියෙල් 10 වැනි දිනට නියම වයස :—.
   අවුරුදු :———— ; මාස :———— ; දින :————.
   (ආ) උපන් දිනය (උප්පැන්න සහතික පිට ඈමිණිය යුතුයි) : ————.
4. ජාතිය :—
   (1) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පෙලපතින් ද යන වග :————.
   (2) ලාංකිකත්වය පෙළපතකින් නම් යට දැක්වෙන අය උපන් තැන දන්වන්න :—.
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
5. අධ්‍යාපනික සහ/හෝ වෙනත් සුදුසුකම් :————.
   (ඉහත 5 (2) වැනි ඡේදයේ ප්‍රකාර සහතික පිටපත් අමුණන්න.)
6. ගුවන් විදුලි ප්‍රචාරය කටයුතු සම්බන්ධයෙන් ඇති පළපුරුද්ද :————.
7. අමුනා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපින යන් :————.
8. සේවා මුක්ත හටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජනය ගන්නේ ද යන වග :————.
   (එසේ නම් සේවයෙන් අස්වී යැමේ සහතිකය හෝ වෙන යම් සාක්ෂි හෝ අමුනා එවිය යුතුයි.)
9. රජය යටතේ කිසිවිටෙක සේවය කර ඇත්නම් ඒ කවදා කොතැනකද යන්න :————.
   (එක් එක් දෙපාර්තමේන්තුවේ කළ සේවා කාලය දැන්විය යුතුයි.)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1024—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**රජයේ සිංහල මධ්‍ය මහා විද්‍යාලවල හා මහා විද්‍යාලවල— II වැනි ශ්‍රේණියේ විද්‍යාලයාධිපති තනතුරු**

21.7.60 වැනි දින රජයේ පාසල්වල සේවයේ නියුක්තව සිටි හා දැනට සේවයේ යෙදී සිටිනු ගුරුවරුන්ගෙන් ඉහත කී තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් දිස්ත්‍රික්කවල ඇති පාසල්වල ඇබෑර්තු ඇත :—

මඩකලපුව.
ත්‍රිකුණාමලය.

2. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයෙහි දැක්වෙන පරිදි පුරවා එවිය යුතු ඉල්ලුම් පත්‍ර 1964.4.15 වැනි දින හෝ ඊට පෙර තමා දිස්ත්‍රික් ගුරුවරයෙකු වශයෙන් සේවය කරන්න කැමති දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අධ්‍යාපන නිලධාරි වෙත ලැබෙන්න එවිය යුතුයි. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයෙහි ඉහල වම් කෙළවරේ "රජයේ සිංහල පාසල්වල II වැනි ශ්‍රෙණියේ විදුහල්පති තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුයි.

3. වැටුප.—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,660—120/2, 180/8, 240/5—6,540.

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :**

(i) මෙම තනතුර ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ;

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවෙක් එක් අවුරුද්දක වැඩ බැලීමේ කාල පරිච්ඡේදයකට යටත්ව පත් කරනු ලැබේ;

(iii) (අ) අයදුම්කරුවන් දිස්ත්‍රික්ක ගුරුවරුන් වශයෙන් සේවය කිරීමට බැඳිය යුතුයි;

(ආ) අයදුම්කරුවෙකුට තෝරා ගත හැක්කේ එක් දිස්ත්‍රික්කයක් පමණි.

5. **අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) (i) පුහුණු උපාධිධරයෙකු හෝ ගෞරව උපාධිධරයෙකු (I වැනි හෝ II වැනි පංතිය) බව, හෝ

(ii) උපාධිය ලැබීමෙන් පසු පස් වසක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධරයෙකු බව, හෝ

(iii) ගුරුවරයෙකු වශයෙන් 15 වසක සේවා කාලයක් ඇති අන්තර් මධ්‍යම සහතික පත්‍රය සමඟ පළමු වැනි පෙළ ද්විතීය පුහුණු වූ සහතික පත්‍රය දරන බව, හෝ

(iv) පුහුණුව ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් 15 වසක සේවා කාලයක් ඇති පළමු වැනි පෙළ සිංහල/ඉංග්‍රීසි පුහුණු ශික්ෂකයෙකු බව, හෝ

(v) ද්විතීය පුහුණු වූ ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර ඇති, ශික්ෂකයෙකු වශයෙන් යටත් පිරිසෙයින් 15 වසක සේවයක් ඇති, පළමු වැනි පෙළ සිංහල පුහුණු වූ ශික්ෂකයෙකු.

**සංලක්ෂ්‍යය.**—ii, iii, iv, v සඳහා, ගුරුවරයෙකු වශයෙන් අවශ්‍ය වන සේවා කාලය 1964.4.15 වැනි දින දක්වා ගණන් ගැනේ.

(ආ) සිංහල පිළිබඳ මනා දැනුමක් ඇති බවට.

**සංලක්ෂ්‍යය.**—සිංහල පිළිබඳ මනා දැනුමක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. කෙසේ වුවද, පත්වීම් ලබන්නන් විසින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල භාෂාවෙන් හෝ සිංහල සාහිත්‍යයෙන් සාමාර්ථය ලබා ගැනීම පත්වීම ලැබී අවුරුදු 3ක් ඇතුළත අවශ්‍ය වනු ඇත. එසේ කළ යුත්තේ ඔවුන් ඒ හා සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා නොමැතිනම් පමණකි.

සිංහල සුදුසුකම් ලබා ගැනීමට අවුරුදු 3ට පසුව ගත වන කාල සීමාව වැටුප් වැඩිවීම් පමාකළ කාල සීමාවක් ලෙස ගණන් ගැනෙනවා ඇත.

(ඉ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවට.

6. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද සහතිකය හෝ පිළිගනු නො ලැබේ.);

(ආ) උපාධි සහතික පත්‍රය හා/හෝ ලබා ගත් වෘත්තීය සුදුසුකම්;

(ඉ) සිංහල පිළිබඳව ලබා ගත් තත්ත්වය දැක්වෙන සහතිකය.

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නො ලැබේ.

7. රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ. මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති කොන්දේසිවලට අමතර වශයෙන් එම කොන්දේසි ද අදාල වනු ඇත.

8. ඉල්ලුම් පත්‍ර හෝ ඒ හා සම්බන්ධ අනික් ලියකියවිලි ඉල්ලුම් කරන දිස්ත්‍රික්ක භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/අධ්‍යාපන නිලධාරීන්ට ලැබෙන සේ එවනු විනා මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුට පෞද්ගලිකව නො එවිය යුතුයි. අයදුම්කරුවන් විසින් මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය පිටපත් කර ගත යුතුයි.

ඉල්ලුම් පත්‍රය තමා කැමැති දිස්ත්‍රික්කය වෙනුවෙන් යොමු විය යුත්තේ පහත සඳහන් අයුරටය :—

(අ) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, මඩකලපුව.

(ආ) අධ්‍යාපන නිලධාරී, ත්‍රිකුණාමළය.

9. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ඇත. සාමාන්‍ය තැපෑලෙන් එවන ලද ඉල්ලුම් පත්‍ර නොලැබීම ගැන ඒ ඒ කාර්යාලවල් විසින් වග කියනු නො ලැබේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964 මාර්තු 10 වැනි දින,
කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

.....................................

### ආදර්ශ අයදුම් පත්‍රය

**රජයේ සිංහල මධ්‍ය මහා විද්‍යාලවල හා මහා විද්‍යාලවල II වැනි ශ්‍රේණියේ විද්‍යාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————. මයා/මිය/මෙනවිය.
2. ගුරුවරයෙකු වශයෙන් ලියා පදිංචි කළ අංකයක් ඇත්නම් එය :————.
3. ලිපිනය :————.
4. අයදුම්කරුගේ උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ පියා :————.
   (ආ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (ඉ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.
6. (අ) ජාතිය :—
   (ආ) ලාංකිකයෙකු නම් ලියා පදිංචිවීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :————.
7. දැනට කරන රක්ෂාවක් ඇත්නම්, සේවා කාලය පිළිබඳ විස්තර :————.
8. සුදුසුකම් :—
   (අ) අධ්‍යාපනික (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :—
   (i) උපාධිය :————.
   විශ්ව විද්‍යාලය :————.
   වර්ෂය :————.
   පෙළ/පන්තිය :————.
   (ii) උපාධියට පෙනී සිටි විෂයයන් :————.
   (ආ) (i) වෘත්තිය (පුහුණුව ලැබූ ස්ථානය, කාලය හා සහතිකයේ පෙළ සඳහන් කළ යුතුයි.) (සහතික පිටපත් ඇමිණිය යුතුයි.) :—
   (ii) පසුගිය 5 වර්ෂය තුළ වෘත්තිය සහතිකයේ සටහන්වල පිටපත් :————.
9. සිංහල පිළිබඳ දැනුම, සමත් වී ඇති උසස්ම විභාගය :————.
10. සේවය කළ පාසල්වල නම් :————.

| සිට | දක්වා | දැරූ තනතුර |
| --- | --- | --- |

11. සුදුසුකම් හෝ පළපුරුද්ද හෝ විශේෂ හිමිකම්, ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.
12. ඉහත සඳහන් තනතුරට පත් කරනු ලැබුවහොත් ———— (සම්පූර්ණ නම ලියන්න) වන මා ———— දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක ගුරුවරයෙකු/ගුරුවරියක වශයෙන් සේවය කිරීමට පොරොන්දු වෙමි. තවද, මා පහත සඳහන් කොන්දේසි වලට එකඟ වෙමි :—
   (i) දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවක් මම නොඉල්ලමි. යම් හෙයකින් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවක් මට දෙනු ලැබුවහොත්, ඒ බව වහාම ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා වෙත දැන්වීමට පොරොන්දු වෙමි;
   (ii) විවාහවීම හෝ අසනීප වීම හෝ යන කරුණු උඩ මම කිසිම ස්ථාන මාරුවක් නොපතමි;
   (iii) දිස්ත්‍රික්ක ගුරු සේවා ක්‍රමය යටතේ පත්වීමක් ලැබ, ඒ බව නොදන්වා දිස්ත්‍රික්කයෙන් පිටතට මා ස්ථාන මාරුවක් ලබා ගැනීමට යත්න දැරීම නිසා ගුරුවරයෙකු/ගුරුවරියක් වශයෙන් මගේ සේවය අත්හිටවනු ලැබුවහොත් මම ඊට එකඟ වෙමි;
   (iv) විනයානුකූල හේතූන් උඩ හෝ පරිපාලන අවශ්‍යතා උඩ හෝ දිස්ත්‍රික්කයෙන් පිටතට මා මාරු කරනු ලැබුව හොත්, එබඳු මාරුවීමකට මම එකඟ වෙමි

————,
ගුරුවරයා/ගුරුවරිය ගේ අත්සන.

දිනය :————.

3–854—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

### අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**සිංහල මාධ්‍ය පාසැල්වලට උපාධිධාරී හා උපාධි අපේක්ෂක විද්‍යා ගුරු භවතුන් බඳවා ගැනීම**

මෙම දෙපාර්තමේන්තුවේ රජයේ පාසැල්වල විද්‍යා උපගුරු තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අයදුම් කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම පුරප්පාඩු ඇත්තේ සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම කරන පාසැල්වලය. පහත දැක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන්, 1964.4.11 වෙනි දිනට හෝ ඊට ප්‍රථම, කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කාර්මික අධ්‍යාපන ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා ලන කවරයේ ඉහළ වම් කෙළවරේ "අයදුම් පත විද්‍යා උපාධිධාරී/උපාධි අපේක්ෂක" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**2. සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :**

(i) මෙම තනතුරු ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් හිමි ස්ථිර ඒවාය;

(ii) ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි රජයේ සේවකයන් නොවන්නවුන් තෝරාගනු ලැබුවහොත්, තුන් අවුරුදු ප්‍රවසන කාලයකට යටත්ව පත් කරනු ලැබේ;

(iii) අයදුම් කරුවන් ලංකාවේ කවර හෝ පෙදෙසක සේවය කිරීමට කැමති විය යුතුය.

**3. වැටුප් :**

(i) විද්‍යා උපාධිධාරී ගුරු භවතෙකුට නියමිත වැටුප් ක්‍රමය: රු. 2,700—10/120, 7/180—5,160 වේ.

(ii) උපාධි අපේක්ෂක විද්‍යා ගුරු භවතෙකුට නියමිත වැටුප් ක්‍රමය : රු. 1,344—18/72, 3/120—3,000 වේ.

**4. අවශ්‍ය සුදුසුකම් :**

(i) 1964.5.1 වෙනි දිනට වයස අවුරුදු 45ට අඩුවිය යුතුයි;

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු, හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින්නකු විය යුතුයි. එම උපාධියට යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන්ගෙන් විෂයයන් දෙකක් වත් ඇතුළත් විය යුතුයි :—

1. භෞතික විද්‍යාව.
2. රසායන විද්‍යාව.
3. උද්භිද විද්‍යාව.
4. සත්ව විද්‍යාව.
5. ශුද්ධ ගණිතය.
6. ව්‍යවහාරික ගණිතය.

(iii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පන්තිවල ඉගැන්වීම සිංහල මාධ්‍යයෙන් කළ හැකි අය විය යුතුයි. අඩු ගණනේ අධ්‍යායන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ප්‍රායෝගික සිංහලෙන් හෝ රජයේ සේවකයන් සඳහා වූ සිංහල ප්‍රවීණතා විභාගයේ IV ශ්‍රේණියේ විභාගයෙන් හෝ සමත් අය විය යුතුය.

5. අයදුම් කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත් වලට පහත සඳහන් සහතික පත්‍ර වල පිටපත් ඇමිණිය යුතුයි :—

(1) උප්පැන්න සහතිකය,

(2) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,

(3) සිංහල පිළිබඳ දැනුම ඇතුළුව, අධ්‍යාපනික සුදුසුකම් තහවුරු කිරීමට අවශ්‍ය සහතික.

6. නියමිත දිනෙන් පසුව ලැබෙන ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ ආරම්භයේ වන රාජ්‍ය සේවා තනතුරු වලට අදාල පොදු කොන්දේසි වලට අවධානය යොමු කළ යුතුය. මෙම නිවේදනයෙහි සඳහන් කොන්දේසිවලට අමතර වශයෙන් එම කොන්දේසි ද බලපානු ඇත.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

## අයදුම් පත්‍රය

### උපාධි/උපාධි අපේක්ෂක විද්‍යා ගුරු පත්වීම්

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය :————.

4. විවාහක අවිවාහක බව :————.

ස්වාමිපුරුෂයා/භාර්‍යාව රජයේ සේවකයෙකු නම් තොරතුරු : ————.

5. (අ) උපන් දිනය :————.

(ආ) උපන් ස්ථානය :————.

6. ජාතිය (ලාංකිකයෙක් නම් පරම්පරාවෙන් ද, ලියා පදිංචි කිරීමෙන් ද) :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :—

(i) උපාධිධරයෙක් ද, උපාධි අපේක්ෂකයෙක් ද :————.

(ii) උපාධිය :————.

(iii) උපාධියට ගන්නා ලද විෂයයන් :————.

(iv) විශ්ව විද්‍යාලය :————.

(v) වර්ෂය :————.

(vi) පෙළ/පන්තිය :————.

8. සිංහල පිළිබඳ සුදුසුකම් :————.

9. වෘත්තීය සුදුසුකම් තිබේ නම් :————.

10. කලින් සේවය :————.

(i) ගුරුවරයෙකු වශයෙන් ලියා පදිංචි කළ අංකය :————.

සේවා විස්තරය :—

| පාසැලේ නම | දින සිට | දින දක්වා |
| --- | --- | --- |
| .................. | .......................... | .................. |

(ii) අනෙක් රජයේ සේවකයෙකු වශයෙන් (විස්තර ඇතුළත් කරන්න) :————.

11. ගුරු තනතුරෙන් හෝ රජයේ සේවයෙන් ඉල්ලා අස්වීමට/සේවයෙන් පහ කිරීමට/නිදහස් කිරීමට හේතු (සම්පූර්ණ විස්තර ඇතුළත් කරන්න) :————.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, රජයේ සේවයෙන් පහ නොකරන ලද බවත්, රජයේ සේවයෙන් අස්වූවෙකු ලෙස සලකා සේවය නතර කිරීමක් සිදුවී නැති බවත්, උත්පත්තියෙන්, ලියා පදිංචි කිරීමෙන් මම ලාංකිකයෙකු බවත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සතුටු බවත් සහතික කරමි.

...............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

–965—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ පාසැල්වල II වෙනි ශ්‍රෙණියේ විශේෂ තනතුරු විද්‍යා හෝ ගණිත ගුරුවරුන් සඳහා

මෙම දෙපාර්තමේන්තුවේ රජයේ පාසැල්වල II වෙනි ශ්‍රෙණියේ විශේෂ තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම පුරප්පාඩු පවතින්නේ සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම කරන පාසැල්වලය. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළිවෙළ විය යුතු ඉල්ලුම් පත්‍ර 1964 අප්‍රියෙල් 11 දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටී.ඊ. ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරවල ඉහළ වම් කෙළවරේ " II වෙනි ශ්‍රෙණියේ විශේෂ තනතුර (විද්‍යා හෝ ගණිත ගුරුවරුන් සඳහා) ඉල්ලුම් පත්‍රය " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුයි.

2. වැටුප් හා දීමනා.—මෙම තනතුරු සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4 හා 180 × 8 හා 240 × 2—රු. 5,820 කි. නියමිත ප්‍රමාණයන්ට අනුව ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවන දීමනාව ද ගෙවනු ලැබේ.

3. සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :

(i) මෙම තනතුරු ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ;

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු සෝදිසි කාලයකට යටත්ව පත් කරනු ලැබේ. ඔවුන් විසින්, ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් දයක මුදල් ගෙවීම තව දුරටත් කරගෙන යනු ඇත.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකු විසින් ම, ඔහුට/ඇයට—

(i) ගුරු වෘත්තියෙහි යෙදී නොසිටි නම්, වයස අවුරුදු 45ට අඩු බව :

(සංලක්ෂ්‍යය.—විකල්ප විශ්‍රාම ගැනීමේ වයස් සීමාව තුළ සිටින අයට විශේෂ තනතුරකට පත්වීමක් ලදහොත් එම පත්වීම ලැබී අවුරුදු තුනක් ඇතුළත සිය මනාපය පරිදි විශ්‍රාම ලැබීමට ඔවුන්ට ඉඩ දෙනු නොලැබේ.)

(ii) යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන් එකක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යාව හෝ ගණිතය පිළිබඳව උපාධියක් හිමි බව :—

(ඒ) භෞතික විද්‍යාව,

(බී) රසායන විද්‍යාව,

(සී) උද්භිද විද්‍යාව,

(ඩී) සත්ව විද්‍යාව,

(ඊ) ගණිතය,

(iii) සිංහල පිළිබඳව දැනුමක් ඇති බව.

සංලක්ෂ්‍යය.—(ඒ) විද්‍යා විෂයයන් එකකට වැඩි ගණනක් සහිතව උපාධිය ලබා ඇති අය, හා

(බී) අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා ඇති අය හෝ පුහුණුව ලබා ඇති අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) යහපත් චරිතයකින් හා ශරීර සනීපයෙන් යුක්ත බව, ඔප්පු වන සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

5. අයදුම්කරුවන් විසින් සවකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලි (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි:—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද සහතිකය හෝ පිළිගනු නොලැබේ;)

(බී) උපාධි සහතික පත්‍රය හා/හෝ ලබාගත් වෘත්තීය සුදුසුකම්;

(සී) සිංහල පිළිබඳව ලබාගත් තත්ත්වය දක්වෙන සහතිකය;

(ඩී) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මෙම තනතුරුවලට පත් කිරීමට යෝග්‍ය බව දක්වෙන, මෑතදී ලබා ගන්නා ලද චරිත සහතික තුනක් (දැනට රජයේ සේවයෙහි නියුක්තව සිටින අයදුම් කරුවන් විසින් මෙම උප ඡේදයෙන් නියමිත සහතික ඉදිරිපත් කළ යුතු නොවේ.)

සංලක්ෂ්‍යය.—(i) මෙම චරිත සහතික හා සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

(ii) රජයේ සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් විසින් චරිත සහතික පිටපත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය.

6. දෙපාර්තමේන්තු ප්‍රධානයන් මගින් ඉදිරිපත් කර නියමිත දිනට පසුව මෙම කාර්‍යාලය වෙත ලැබෙන ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගත යුතුයයි එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කරතොත් මිස ඒවා බාරගනු නොලැබේ.

7. රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ 1 වන කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ. මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති කොන්දේසිවලට අමතර වශයෙන් එම කොන්දේසි ද අදාල වනු ඇත.

8. ඉල්ලුම් පත්‍ර හෝ ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි ටී.ඊ. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂට ලැබෙන සේ එවනු විනා මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුට පෞද්ගලිකව නොඑවිය යුතුයි. අයදුම්කරුවන් විසින් මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය පිටපත් කරගත යුතුයි.

9. ඉල්ලුම් පත්‍රය ලැබුන බව දන්වනු ඇත. සාමාන්‍ය තැපෑලෙන් එවන ලද ඉල්ලුම් පත්‍ර නොලැබීම ගැන මෙම කාර්‍යාලය විසින් වග කියනු නොලැබේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964ක්වූ මාර්තු මස 18 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

## ආදර්ශ අයදුම් පත්‍රය

**විද්‍යා හෝ ගණිත ගුරුවරුන් පිළිබඳ රජයේ පාසැල්වල II ශ්‍රේණියේ විශේෂ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   මහත්මයා/මහත්මිය/මෙනෙවිය
2. ලිපිනය :————.
3. අයදුම්කරුගේ උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
4. උපන් ස්ථානය—
   (අ) අයදුම්කරුගේ පියා :————.
   (ආ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මීමුත්තා :————.
5. (අ) ජාතිය————.
   (ආ) ලාංකිකයෙකු නම් ලියාපදිංචි වීමෙන්ද? පරම්පරාවෙන්ද ? යන වග :————.
6. දැනට කරන රක්ෂාවක් ඇත්නම් සේවා කාලය පිළිබඳ විස්තර :————.
7. සුදුසුකම් —(අ) අධ්‍යාපනික (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

| (I) උපාධිය (පෙළ/පන්තිය) | විශ්ව විද්‍යාලය | වර්ෂය |
|---|---|---|
| | | |

(II) උපාධියට පෙනී සිටි විෂයයන් :—

1. ————.
2. ————.
3. ————.
4. ————.

(ආ) වෘත්තීය (පුහුණුව ලැබූ ස්ථානය, කාලය හා සහතිකයේ පෙළ සඳහන් කළ යුතුය. සහතික පිටපත් ඇමිණිය යුතුය.) :————

8. සිංහල පිළිබඳ දැනුම ; සමත්වී ඇති උසස්ම විභාගය :————.
9. පාසැලේ නම :————.
   දැරූ තනතුර :————. ————සිට————දක්වා.
10. සුදුසුකම් හෝ පළපුරුද්ද හෝ විශේෂ හිමිකම්, ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.
11. ඉදිරිපත් කරන චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන්—
    (i) ————.
    (ii) ————.
    (iii) ————.

ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි කළ අංකයක් ඇත් නම්, එය :————

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය————.

3–963—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක තනතුර—ඉංග්‍රීසි**

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක (ඉංග්‍රීසි) තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබෙයි. මෙම දන්වීමේ අග දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු. අයදුම්පත් 1964 අප්‍රියෙල් 10 වැනි දින නොඉක්මවා ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ආකෘති පත්‍ර වෙනම සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර “ කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක—ඉංග්‍රීසි ” යන්න පහැදිලි අකුරෙන් ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,700—10 × 120, 6 × 180—රුපියල් 4,980 කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. මුල් වතාවේ තනතුර දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකටය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම යට දැක්වෙන කරුණු ස්ථුට කෙරෙන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1963 අප්‍රියෙල් 10 වැනි දිනට වයසින් අවුරුදු 21 ට නොඅඩු හා 40 ට නොවැඩි බව. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ට මේ වයස් සීමාව බලපවත්වන්නේ නැත.)

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු බව. එසේ නැත් නම්

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් හෝ සමත් ඉංග්‍රීසි පුහුණු ගුරු සහතිකය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයෙක අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ හිමි වූවකු බව,

(ඇ) විශේෂයෙන් නොඑක් වයස් තරාතිරම්වලට ඉගැන්වීමේ පළපුරුදුකම් ඇත්තකු බව,

(ඈ) තවද, ඉංග්‍රීසි සාහිත්‍යය, කලා හා සංගීතය, විද්‍යාව, ආදී විෂය යන් පිළිබඳ හා ලාංකික ජනතාවගේ ඉතිහාසය, සංස්කෘතිය හා චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුම ද, ඉංග්‍රීසි රචනයේ දක්ෂතාවය හා ගුවන් විදුලි ප්‍රචාර කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇත්තකු බව.

**සංලක්ෂ්‍යය.**—ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමාර්ථය ලැබ ගුවන් විදුලි සේවා පිළිබඳ පස් අවුරුද්දක පළපුරුද්දක් ඇති ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි කටයුතු පිළිබඳ නිරතව සිටින සේවකයන්ගෙන් මෙම සුදුසුකම් ඉල්ලා සිටිනු නොලැබේ.

(ඉ) මනා චරිතයකින් හා කායික සෞඛ්‍යයකින් ද යුක්ත වූවකු බව.

5. අයදුම්කරුවන් විසින් යට සඳහන් ලියවිලි වල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි :—

(i) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය. සහ

(ii) අයදුම්කරුගේ චරිතය, සුදුසුකම්, කාර්යශූරත්වය සහ තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යත්වය දැක්වෙන මෑතකදී ලබාගත් සහතික දෙකක්. (රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මේ උප ඡේදය යටතේ සහතික අනවශ්‍යය.)

**සැළකිය යුතුයි.**—මේ සහතික අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයට කැඳවූවහොත් හා එවිටය.

6. නියමිත දින ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත කාලසීමාව තුළදී ලැබී ඇත් නම් හා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එය පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස පිළිගනු නොලැබේ.

7. රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ මුල දැක්වෙන පොදු කොන්දේසි බලන්න.

8. ඉල්ලුම්පත් හෝ ඒ පිළිබඳ සෙසු ලියවිලි හෝ එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

9. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

එස්. බී. සේනානායක,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1964 මාර්තු මස 26 දින,
කොළඹ 7.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**කණිෂ්ඨ (පාඨශාලා) වැඩසටහන් සහායක තනතුර—ඉංග්‍රීසි**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.
2. සථිර ලිපිනය :————.
3. (අ) 1964 අප්‍රියෙල් 10 වැනි දිනට නියම වයස :—
   අවුරුදු :————, මාස :————, දින :————.
   (ආ) උපන් දිනය (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි) :
   ————.

4. ජාතිය :—.

(1) ලාංකිකත්වය පෙළපතින්ද ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.

(2) ලාංකිකත්වය පෙළපතින් නම් යට සඳහන් අය උපන් තැන දන්වන්න :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් (සාක්ෂ්‍ය ලෙස ඇමුණූ ලියවිලි කවරේද?) : ————.

6. ඉංග්‍රීසි සාහිත්‍ය, කලා, සංගීතය, විද්‍යාව, ඉතිහාසය, යනාදි විෂය යන් සම්බන්ධයෙන් ඇති දැනුම පිළිබඳ විස්තර (අමුනා ඇති ලියවිලි කවරේද ?) :————.

7. අමුනා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනය : ————.

8. සේවා මුක්ත හටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග (එසේ නම් සේවාවෙන් අස්වීමේදී ලබාගත් සහතිකය හෝ සමාන සාක්ෂිවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

9. ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද :————.

10. රජයේ සේවයේ කිසි කලෙක යෙදී සිටියේ නම් ඒ කවදා කොතනද යන වග (ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාල පරිච්ඡේදයන් සඳහන් කළ යුතුයි) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————,

3-1023—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව

**රේඩියෝ හා විදුලි භාණ්ඩ දෙපාර්තමේන්තුවේ කළමනාකාර තනතුර**

ඉහත කී තනතුර සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මේ තනතුරට හිමි මාසික වැටුප රු. 400—30×6 සහ 40×6—රු. 940ක් වෙයි. මීට අතිරේකව ජීවන වියදම් දීමනා, විශෙෂ ජීවන වියදම් දීමනා හා ගෙවල් කුලී දීමනා ද රජයේ ගෙවුම් ප්‍රමාණයන් අනුව ගෙවනු ලැබේ.

පහත සඳහන් කොන්දේසි මේ තනතුරට අදාල වන්නේ ය :—

1. වයස.—අවුරුදු 40ට නොවැඩිවීම.
2. සියලු වර්ගවල විදුලි උපකරණ ආනයනය කිරීම, සැපයීම හා සවිකිරීමත් කරන විශාල වෙළඳ ආයතනයෙක විධායක තනතුරක, යටත් පිරිසෙයින් අවුරුදු 5ක පළපුරුද්දක් තිබීම.
3. ඇපය.—මුදලින් රු. 3,000ක් සහ විශ්වාස සහතික ඔප්පුවකින් රු. 5,000කි.

මේ සඳහා ඉල්ලුම් පත්, 1964 අප්‍රේල් 15 වනදාට ප්‍රථම ලැබෙන සේ, කොළඹ, තැපැල් පෙට්ටිය 990, සතොස සාමාන්‍යාධිකාරි නමට එවිය යුතුය.

වී. ඒ. ජේ. සේනාරත්න,
සාමාන්‍යාධිකාරි.

64.3.5 වනදා,
කොළඹ 2, වොක්සෝල් වීදියේ අංක 21 දරණ තැන,
සතොස දීය.

3-899—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## 1962 සැප්තැම්බර් මස පවත්වන ලද මධ්‍ය ලිපිකාර විභාගය

1964 ජනවාරි මස 3 වෙනි දින අංක 13,901 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1963 දෙසැම්බර් මස 28 වෙනි දින දරණ නිවේදනයට අමතර වශයෙනි. 1962 සැප්තැම්බර් මස පවත්වන ලද මධ්‍ය ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව දුම්රිය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියට පත් කිරීම සඳහා පහත නම් සඳහන් අපේක්ෂකයින්ද තෝරා ගෙන ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

| නම |  | ලිපිනය |
|---|---|---|
| අමරසේන, ග. අ | ... | කොටකන්ද, හබුරුගල. |
| ආරියවංශ, ම. කු. | ... | මුල්ගුරු මහතා බාරේ, කැ/මාවතගොඩ, ප්‍රාථමික පාසැල, හබුරුගොඩ. |
| ඇල්ප්‍රඩ්, ස. | ... | 37/6, මූර් වීදිය, යාපනය. |
| උක්කුබණ්ඩා, හේ. මු. | ... | බෝගමුව, බෝයගනේ, කුරුණෑගල |
| එදිරිසිංහ, උ. ර. | ... | ඉඩම් අංශය, දිසාපති කායශීලය, කළුතර. |
| එන්සන්, ම. ක. | ... | මරික්කසිවත්ත, තල්පෙ උතුර, උනවටුන. |
| ඒකනායක, වී. රො. | ... | ආහාර පාලක ශාඛාව, කච්චේරිය කොළඹ. |
| කරුලසිංහම්, මු. | ... | අංක 2, සිනියර් පටුමග, වන්නාර්පන්නෙයි, නැගෙනහිර යාපනය. |
| කරුණාදාස, තෑ. ගො. | ... | කෝඹල, ඉමදූව. |
| කරුණාරත්න, ඉ. අ. | ... | වළකුඹුර, අලව්ව. |
| ක්‍රිෂ්ණමූර්ති, ව. | ... | 196, ජම්පටාවීදිය, කොළඹ. |
| ගාමිණිදාස, ම. දො. | ... | ආහාර කොමසාරිස් කායශීලය, අංක 330, යූනියන් ප්‍රදෙස, කොළඹ 2. |
| ගාර්දින්, කා. | ... | කිරිමැටිය, රත්ගම, දෙඩන්දූව. |
| ගුණතිලක, උ. හේ. | ... | "තිලක", වෙලේගොඩ, මාතර. |
| ගුණපාල, ජ. ක. අ. | ... | වැලිමඩේවත්ත, නාසිම්බල, තිහගොඩ. |
| ගුණසේකර, කී. ද. | ... | ගල්කැටිය, අහංගම. |
| ගුණසේකර, නා. ආ. අ. ඩ. | ... | ආගරගෙදරවත්ත, ගනේගම, බද්දේගම. |
| ගුණසේකර, නි. ඩ. | ... | අංක 26, විශාඛා පාර, ගම්පහ. |
| චන්ද්‍රදාස, දෙ. ලි. ආ. | ... | ජාතික නිවාස ප්‍රාදේශීය කායශීලය, මධ්‍යම වෙළඳපොල, මහනුවර. |
| චන්ද්‍රදාස, හෙ. ආ. | ... | මූකලන්යාය, කිරිකදුව, කුරුණෑගල. |
| චන්ද්‍රසේන, ලී. හැ. | ... | විල්ගමුව, මාතලේ. |
| ජයලත්, ලෙ. | ... | දකුණු උඩුව, කුඩා උඩුව. |
| ජයසුන්දර, දෝ. ඉ. | ... | සේවක අර්ථ සාධක අරමුදල් කායශීලය, තැ. පෙ. 1508, කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ. |
| ජයසේන, බ. මු. | ... | 41, මවුන්ට්මේරි මාවත, කොළඹ 10. |
| ජයසේකර, අ. පේ. දු. | ... | කු/වැවගම. |
| ජස්ටින්, ම. දො. | ... | 37 ඒ, උතුරු බටගම, ජාඇල. |
| ජිනදාස, අ. මු. පු. | ... | "දඹසෙවන", කල්ලන්චිය, ගල්ගමුව. |
| ජිනදාස, බු. | ... | පරගස්තොට. |
| ජිනදාස, ච. දො. | ... | දගොන්න, දෙමන්හන්දිය. |
| ඩයස්, ජ. බ. රෝ. | ... | පත්තඹුවන, මිනුවන්ගොඩ. |
| ඩයස්, ම. පි. මො. | ... | 14/2, "සිරිත් සරු", වැල්ලබඩ, පානදුර. |
| ඩේවිඩ්, කා. ර. | ... | ගිනිහිගම, පැපිලියවල. |
| තිලකරත්න, ඉ. ආ. | ... | වැලිවිටිය, උනන්විටිය, බද්දේගම. |
| තිලකරත්න, ප. අ. | ... | කුළුපන, පොකුණුවිට. |
| දල්පතාදු, කො. ඇ. ජෝ. පි. | ... | 7, මිනිවන්ගොඩ පාර, මීගමුව. |
| දසනායක, නි. එ. | ... | නාසිවලපාර, උඩුගම්පොළ. |
| දිසානායක, කැ. මු. | ... | ගම්සභා කායශීලය, කුරුවිට. |
| දිසානායක, ර. මො. | ... | අළුත්ගෙදර, ගම්මන, පෙතුහැර. |
| ධනපාල, කෝ. ග. | ... | දොරණගොඩ, උඩුගම්පොළ. |
| ධනසිරි, උ. ව. | ... | තිත්දාන, බටපොල. |

| නම | ලිපිනය |
|---|---|
| ධර්මසේන, කා. මූ. හි. බ. ... | හුණුපොලගම, හිරුතලාන, තෑගම්පහ. |
| නන්දසේන, ක. දො. ... | කලපුගම, වස්කඩුව. |
| පැත්රිස්, ජ. ලි. ... | මීකඳමුල්ල, අතුරලිය, අකුරැස්ස. |
| පියදාස, ලි. ... | රත්මල්ගොඩ, පෝරුවදණ්ඩ. |
| පියදාස, දි. ... | ගෙදරවෙල, දොරවක. |
| පියදාස, දේ. පේ. ... | අත්තනගල්ල, උරාපොල. |
| පියසේන, ක. මු. ... | පේරගස්පිටිය, හාලිඇල. |
| පීටර්, වි. ... | දෙරපේ අඟුළුගහ. |
| පුංචිහේවා, නො. ක. ... | ලස්සගෙනෙවත්ත, දැරණියගල. |
| පොඩිසිංඤෝ, මා. ගෙ. ... | වෙලේගෙදර, රත්මල්කඩුව, ගම්පොළ. |
| ප්‍රේමචන්ද්‍ර, පෙ. හෙ. ... | රොජර්සන්ගම, තිස්පනේ, නාවලපිටිය. |
| පෙරේරා, හෙ. ම. ... | විදුලි සංදේශ පාලක කාර්‍යාලය, කොළඹ. |
| පෙරේරා, කො. අ. එ. ... | සීතාඑළිය, නුවරඑළිය. |
| පෙරේරා, ග. ජෝ. ප. ... | මහවත්ත, පමුණුගම. |
| ප්‍රනාන්දු, උ. නි. පි. ... | 300, මහා විහාරපාර ලක්ෂපතිය, මොරටුව. |
| ප්‍රනාන්දු, කො. ර. ... | 63, පන්සල පාර, බේරුවල. |
| ප්‍රනාන්දු, මෙ. අ. සි. ... | නො. 9, විවේකාරාම පාර, උතුරු කළුතර. |
| ප්‍රනාන්දු, හේ. පි. සි. ... | 103, මාවතගම, පාදුක්ක. |
| ප්‍රසාද්, ප. ජා. ... | පුලියන් කුඩාල් පාර, කයිට්ස්. |
| මදුරසිංහ, ප. ... | 20, "මදුරසිරි", ක්‍රිප්ස් පාර, ගාල්ල. |
| මානික්කවාසගර්, මු. ව. ... | උතුරුවෙලනාසි, වෙලනාසි. |
| රණතුංග, සි. ගා. ... | යෞන් ගම්මුල්ල, යක්කල. |
| රනවීර, වා. ... | කනත්ත පාර, පවුවත, දොඩන්දූව. |
| රනසිංහ, වි. ර. ආ. සි. ... | 350, මහර-නුගේගොඩ, කඩවත. |
| රත්නායක, ජ. මු. ... | සන්දනගමුව, ගුරුගොඩැල්ල, වැලිපැන් නගහමුල්ල. |
| රත්නායක, ම. බ. ... | අංක 40, අටලහගොඩ මාවත, වත්තේගම. |
| රත්නායක, හේ. මු. ... | පහළ බලදොර, කොබෙයිගනේ. |
| රම්බණ්ඩා, අ. මු. ... | ගොඩමුන්න, උඩිස්පත්තුව. |
| රූපසිංහ, උ. ලි. ආ. ... | නාහල්ල, නාබොඩ. |
| රොමියෙල්, කු. ගෙ. ... | වැරල්ලගම, මීරවනගොඩ. |
| ලසනල්, ග. ලි. ... | ඉබුල්ගසවත්ත, බෝරතුඩුව, හෝනාපිනුවල. |
| ලියනගේ, පි. ළ. ... | "දෙවිඳුත් සෙවන" කඹුරුපිටිය. |
| වනිගසේකර, ආ. ලෙ. ... | 63/2, රත්තනපිටි පාර, ගංගොඩවිල, නුගේගොඩ. |
| වික්‍රමතිලක, වි. ... | හෝමදොලා, උඩුගම, ගාල්ල. |
| වික්‍රමසිංහ, අ. වි. ... | ප්‍රාථමික පාසැල, දෙණියාය. |
| විජේරත්න, හේ. ක. ... | 63/2, රත්තනපිටි පාර, ගංගොඩවිල, නුගේගොඩ. |
| විජේසුන්දර, දෝ. සෝ. ... | මින්නේරිය. |
| විතානආරච්චි, ඩේ. පෙ. ... | පොලිස් මධ්‍යම ගරාජය, නාරාහේන්පිට. |
| වීරතිලක, අ. මූ. ... | තුලාවල, කොස්වත්ත. |
| විල්ප්‍රඩ්, ම. ආ. ... | ඇම්. ඩබ්. පීරිස් බාරේ, අරණායක පාර, මාවනැල්ල. |
| විල්බට්, ක. ර. ... | 326/21, අප්පල්දූව, දන්ගෙදර, ගාල්ල. |
| විල්මන් සිංඤෝ, මා. වි. ... | මාරඹෙ, ගැටහැත්ත. |
| සත්‍යපාල, සා. ... | උග්ගොඩවත්ත, අදලෙද්දූව, යටියන. |
| සවිනෝරිස්, බ. ආ. ... | නැඳිගම්මල, ගෝනගමුව, තිස්සමහාරාමය. |
| චිත්තම්පලම්, ප. ... | නැගෙනහිර කරවෙඩ්ඩි, කරවෙඩ්ඩි. |
| සිරිසේන, අ. කො. ... | ගම්බාරගෙදර, අමරතුංගම, උස්වැව, තංගල්ල. |
| සිරිසේන, ඩි. ... | වෙලේගොඩහේන, නාකුළුගමුව, ගලගම. |
| සිල්වා, මී. ස. ... | 139, කොටුගොඩ. |
| සිල්වා, ර. මෙ. ද. ... | නො. 10, සුනියන් පෙදෙස, දෙහිවල. |
| සිවඥානම්, වෙ. ... | සස්ත්‍රිකුලන් කුලම්, වවුනියාව. |
| සිවපාදම්, ත. ... | එහම්පරම් පාර, ත්‍රිකුණාමලය. |
| සුබසිංහ, ර. වා. ... | "සිංහවිලා", ඉදල් ගස්හින්න. |
| සුබ්‍රමනියම්, සෝ. ... | නැගෙනහිර චුල්ලිපුරම්, චුල්ලිපුරම්. |
| සූරියආරච්චි, හි. සො. ... | දිස්ත්‍රික් කෘෂිකර්ම, කාර්‍යාලය, හම්බන්තොට. |
| සෙල්වවිනායගම්, වේ. ... | රාලං.ගු.හ., තැ. පෙ. 594, කොළඹ 2. |
| සෝමපාල, ස. ආ. ... | ගගුල්විටිය වත්ත, රත්නපුර. |
| හතුරුසිංහ, දෝ. රු. ... | බටගොඩ, ගල්පාත. |
| හේමපාල, ව. ක. ... | "වැලිතලා", වීරපාන, ඕපාත. |
| හේරත්, ස. ජ. ... | කෙන්ගල්ල, මහනුවර. |
| හේරත්, සි. ව. ... | සි. 51, බොකලවෙල, අඹතැන්න. |
| හේරත්, හේ. මු. බ. බ. ... | දෙහිඳෙනිය, මුරුතලාව. |
| හේවාවිස්ස, වි. බ. ... | 137, හේවාවිස්ස, මාරස්සන. |

2. මෙම අපේක්ෂකයින්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනී. එහෙත් පුරප්පාඩු ඇති වන හැටියට පත්වීම් ඉදිනු ලැබේ. සියළුම පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වේ. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට යටත් වන අතර, දුම්රිය ලිපිකාර සේවයේ කොන්දේසිවලට යටත් වෙනවා ඇත.

3. දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අපේක්ෂකයින්ට ලියා දන්වනු ලැබේ.

කීර්ති වීරක්කොඩි,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙනුවට.

මහා භාණ්ඩාගාරය, කොළඹ,
1964.3.18 දින දීය.

3–964—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාර අංකය : 1/23/7/11 (ඊ)

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ සිංහල විභාගය 1964—මැයි

විභාගය පවත්වන දින : යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයක්, සිංහලෙන් ටයිප් ගැසීම මැනවින් දත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන් සඳහා 1964 මැයි මස 23 වැනි දින සිට විභාග කොමසාරිස් විසින් පහත සඳහන් මධ්‍යස්ථානයන්හි දී පවත්වනු ලැබේ.

බස්නාහිර පළාත—කොළඹ, ගම්පහ, කළුතර, අවිස්සාවේල්ල, මීගමුව.
මධ්‍යම පළාත—මහනුවර, මාතලේ, නුවරඑළිය.
දකුණු පළාත—අම්බලන්ගොඩ, ගාල්ල, මාතර.
උතුරු පළාත—යාපනය, වවුනියාව.
නැගෙනහිර පළාත—මඩකලපුව, ත්‍රිකුණාමලය.
වයඹ පළාත—හලාවත, කුරුණෑගල.
උතුරු මැද පළාත—අනුරාධපුරය.
ඌව පළාත—බදුල්ල.
සබරගමුව පළාත—කෑගල්ලර, රත්නපුරය.

අපේක්ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති කිසියම් මධ්‍යස්ථානයක් වෙතොත් එම මධ්‍යස්ථානය අවලංගු කෙරෙනු ඇත.

2. **වැටුප් ක්‍රමය.**—(i) සමර්ථ වන අපේක්ෂකයෝ වර්ෂයකට රුපියල් 960න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 72 බැගින් වූ වැටුප් වැඩිවීම් වලින් රුපියල් 2,688 තෙක් නගින්නාවූ වැටුප් ක්‍රමයක් සහිත යතුරු ලේඛක සේවයට පත් කරනු ලබන්නා හ. මෙම වැටුප් ක්‍රමයෙහි රුපියල් 1,320 රුපියල් 1,608 සහ රුපියල් 2,184 යන වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්තයන් සඳහා " නව ප්‍රවේශකයන් " වශයෙන් සලකනු ලබන සාමාර්ථය ලද අපෙක්ෂකයන් වාර්ෂික වැටුප රුපියල් 1,320 පියවර ඉක්මවීමට පෙර, පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය ප්‍රමාණයේ සිංහල භාෂාව පිළිබඳ විභාගයකින් සමත් විය යුතු ය. වාර්ෂික වැටුප රුපියල් 1,320 උපයා ගැනීම සඳහා අපේක්ෂකයෙකුහට ඇත්තේ තම පත්වීම ස්ථිර කළ දිනයේ සිට අවුරුදු දෙකකට අඩු කාලයක් නම් හෝ පත්වීම ස්ථිර කරනු ලැබූ දිනයේ දී වාර්ෂික වැටුප රුපියල් 1,320 ගෙවා තිබේ නම් හෝ එම නිලධාරියා විසින් තම පත්වීම ස්ථිර කළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත දී එකී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. පත්වීම ස්ථිර කරනු ලැබූ දිනය යනුවෙන් මෙහි හැඳින්වෙනුයේ ආධුනික කාලය/පරීක්ෂණ කාලය අවසන් වීමේ දිනයයි. නියමිත කාලය ඇතුළත දී එකී විභාගයෙන් අසමත් වුවහොත් දෑවුරුදු කාල සීමාව ඉක්මවීමෙන් පසු යෙදෙන වාර්ෂික වේතනාධිකය පමා කරනු ලැබේ.

3. **සේවා කොන්දේසි.**—(i) සාමාර්ථය ලද පිරිමි අපේක්ෂකයන් පත් කරනු ලබන දින පටන් තුන් අවුරුදු ආධුනිකත්වය ඇතිව මෙම සේවයට පත් කරනු ලැබේ. ඔවුන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් සහිත ය. සාමාර්ථය ලද අපේක්ෂිකාවන් පළමුවෙන් අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ පත් කරනු ලැබේ. ඔවුන් පත්වීමේ දින සිට අවුරුදු තුනක පරීක්ෂණ කාල සීමාවකට යටත් වෙයි. එම අපේක්ෂිකාවන්ට අවුරුදු දහයක සේවය සම්පූර්ණ කිරීමට පෙර, ඕනෑම අවස්ථාවක දී, විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළ හැකි ය. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව නැවත එය අවලංගු කළ හැකි නො වේ. පරීක්ෂණ කාල සීමාව තුළ දී එසේ කැමැත්ත දක්වන අපේක්ෂිකාවන් ගේ පත්වීම් ඉන්පසුව ආධුනික තත්ත්වයට පමුණුවනු ලැබේ. එසේ ආධුනික තත්ත්වයේ සිටිය යුතු කාල සීමාව තුන්අවුරුදු පරීක්ෂණ කාල සීමාවෙන් ඉතිරි කොටසට සමාන වෙයි.

(ii) මෙම විභාගයේ ප්‍රතිපල අනුව යතුරු ලේඛක සේවයට පත් කරනු ලබන අපේක්ෂකයන් ස්ථාන-මාරු කිරීම් වලට යටත් ය. එසේම ලංකාවේ ඕනෑම ස්ථානයකට ඔවුන් පත් කිරීමට හැකි වෙයි.

(iii) සාමාර්ථය ලැබූ අය, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස ද විශේෂයෙන් ම 1956 යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධානයන් ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පණවා ඇති හෝ මින් මතුවට පණවනු ලබන හෝ කිසියම් ව්‍යවස්ථාවන් වෙතොත් ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

(iv) අතිරේක දීමනා සහ සේවාවේ වෙනත් කොන්දේසි දැන ගැනීම සඳහා මේ " ගැසට් " පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බැලිය යුතු ය.

(v) යතුරු ලේඛක සේවය සාමාන්‍ය ලිපිකාර සේවයේ කොටසක් නොවේ. එහෙයින් යතුරු ලේඛක සේවයේ නිලධාරීන්ට සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියට උසස් වීම සඳහා පැවැත්වෙන විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නො ලැබේ. එහෙත් යතුරු ලේඛක සේවයේ පත්වීම් ස්ථිර වූවාට පසු වයස සහ අධ්‍යාපන සුදුසුකම් ගැන නො සලකා ඔවුන්ට ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට බඳවා ගැනීමේ විභාගයට පෙනී සිටීමට අවසර දෙනවා ඇත.

(vi) අනුමත කර ඇති යතුරු පුවරුමේ ටයිප් ගැසිය නොහැකි, සාමාර්ථය ලබන අපේක්ෂකයෝ රජය විසින් සලස්වනු ලබන, අනුමත යතුරු පුවරුවේ ටයිප් ගැසීම පුහුණුවීමේ පාඨ පන්තියක හදරා නියම කරනු ලබන කාලසීමාවක් ඇතුළත දී නියමිත පරීක්ෂණයකින් සමත විය යුත්තා හ.

4. **සුදුසුකම්: සාමාන්‍ය කොන්දේසි.**—(i) අපේක්ෂකයෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තා හ.

(ii) අපෙක්ෂකයෝ ලාංකිකයෝ විය යුත්තා හ*.

(iii) අපේක්ෂකයන්ට පහත දක්වෙන සහතික වලින් යටත් පිරිසෙයින් එකක්වත් තිබිය යුතු ය.

(අ) ලංකා පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය ;
(ආ) ලන්ඩන් මැට්‍රිකියුලේෂන් සහතිකය හෝ කෙම්බ්‍රිජ් සීනියර් සහතිකය.
(ඇ) ලංකා ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතිකය.
(ඈ) විභාග දෙපාර්තමේන්තුවේ සිංහල වාණිජ සහතිකය.
(ඉ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව ; අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ තවත් විෂයයන් සතරකින් එක අවස්ථාවේ දී විෂයයන් පහකට නො අඩුවෙන් සාමාර්ථය ලබා ඇති අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) ;
(ඊ) ලංකාවේ අපේක්ෂකයන්ට නියමිත පරිපාටිය යටතේ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ (London Chamber of Commerce) වාණිජ අධ්‍යයන සහතිකය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛන යතුරු ලේඛක යන්ගේ කොට්ඨාශය) හෝ උසස් වාණිජ අධ්‍යයන සහතිකය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛන යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) ;
(උ) ලංකා වාණිජ මණ්ඩලය (Ceylon Chamber of Commerce) සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද වාණිජ අධ්‍යයන සහතිකය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) හෝ උසස් වාණිජ අධ්‍යයන සහතිකය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛන යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) ;
(ඌ) ලංකා කාර්මික විද්‍යාලයේ (ගණන් තබන්නන් සඳහා වූ හෝ ලඝු ලේඛන යතුරු ලේඛකයන් සඳහා වූ) වාණිජ සහතිකය හෝ උසස් වාණිජ සහතිකය ;

**සැලකිය යුතුයි.**—මෙම විභාගයට අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පළමුව ප්‍රතිඵල පිට නොවී ඇති ඉහත කී කවර විභාගයකට හෝ පෙනී සිටි අපේක්ෂකයන්ගේ අයදුම් පත් භාර ගනු නො ලැබේ.

(iv) 1964 මැයි මස 1 වැනි දිනට අපේක්ෂකයන්ගේ වයස අවුරුදු 17ට නො අඩුවත් අවුරුදු 26 ට නො වැඩිවත් පැවතිය යුතු ය.

* ආණ්ඩුවේ සේවයට බඳවා ගැනීමේ සියළු අවස්ථාවන් සඳහා " ලාංකික " යන වචනය විග්‍රහ කරනුයේ උත්පත්තියෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි වූවන් වශයෙනි.

5. **සුදුසුකම්.**—ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවා වන්හි නියුක්ත වූ එහෙත් ඡේවා වසමට අයත් නොවන සේවකයන්ට හා යුද හමුදවන්හි යෙදී සිටි සේවාමුක්ත වූවන් ට ද දෙනු ලබන විශේෂ අනුග්‍රහ.

(i) එක්සත් රාජධානියට අයත් සේවාවන්හි යෙදී සිට 1956 ජූලි මස 6 වැනි දින හෝ ඉන් පසුව හෝ සේවයෙන් ඉවත් කරනු ලැබූ ඡේවා වසමට අයත් නොවන ලාංකික සේවකයන් හෝ යුද කඳවුරු ආපසු ගැනීමට ආණ්ඩුව විසින් කරන ලද තීරණය නිසා සේවයෙන් ඉවත් කරනු ලැබීමට භාජනව සිටින අය ද, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි පෙරිය කරච්චියට, නාරාහේන්පිට පිහිටි රාජකීය නාවික ගුවන් විදුලි මධ්‍ය ස්ථානය (ඇන්ඩර්සන් ගුවන් විදුලි මධ්‍යස්ථානය) ගෙන යාමට ආණ්ඩුව මගින් කරන ලද තීරණය හේතුකොට ගෙන 1954 සැප්තැම්බර් මස 27 වැනි දිනට පසුව සේවයෙන් ඉවත් කරන ලද අය ද, පහත දකවෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙම ගණයට අයත් අපේක්ෂකයන්ට මෙහි 4 වැනි ඡේදයෙහි (iv) කොටසෙහි නියමිතව ඇති වයස් සීමාව ගණන් ගැනීමේ දී තමන් එක්සත් රාජධානියට අයත් සේවාවන්හි සේවය කළ කාලසීමාව තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ. එහෙත් එසේ කිරීමට ඉඩදෙනු ලබන්නේ ඔවුන්ගේ තම සේවා කාලය අඛණ්ඩව ද සතුටුදයකව ද, පැවතියේ නම් පමණකි.

(ආ) 1964 අප්‍රේල් මස 1 වැනි දිනට හෝ ඉන් පෙර හෝ එක්සත් රාජධානියේ සේවාවන් යටතේ යටත් පිරිසෙයින් සිව් අවුරුද්දක සතුටුදයක අඛණ්ඩ සේවයක් සපුරා සිටි එහෙත් 4 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින් තමන් 7 (iii) ඡේදයෙහි (ආ) (i) කොටස යටතේ සඳහන් වුණු විභාග වලින් යටත් පිරිසෙයින් එකකින්වත් සාමාර්ථ්‍යය ලබා ඇතොත්, මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) යුද හමුදවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අය පහත දක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙහි 4 වැනි ඡේදයෙහි (iv) වැනි කොටසෙහි දක්වන ලද වයස් සීමාව ගණන් ගැනීමේ දී, අවඥ සගහත ලෙස සේවයෙන් නෙරපන ලද හෝ සේවයෙන් පහ කරන ලද හෝ අවඥ සහගත ලෙස සේවයෙන් නිදහස් කරන ලද හෝ කිසියම් දුරාචාරී බවක් නිසා සේවයෙන් අස්වීමට සිදු වූ හෝ තැනත්තන් හැර සේවා මුක්ත වූ අන්‍යයන්ට හෙවත් උප සේවකයන්ට හෝ නිලධරයන්ට හෝ හේවායන්ට හෝ තමන් ස්ථිර හමුදවේ සේවය කළ කාලසීමාව තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) අවුරුදු හතරකට නො අඩු කාලයක් නිත්‍ය භට හමුදවේ යෙදී සිටි එහෙත් මෙහි 4 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින් තමන් 7 (iii) ඡේදයෙහි (ආ) (i) කොටස යටතේ සඳහන් කරන ලද විභාගයන් අතුරෙන් යටත් පිරිසෙයින් එකකින් වත් සාමාර්ථය ලබා ඇතොත් මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. **සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා අස් කරනු ලැබූ ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ අනුග්‍රහ.**—ස්ථිර වූ හෝ තාවකාලික වූ හෝ නිලයක යෙදී ආණ්ඩුවේ සේවය කළ, එහෙත් ස්වකීය වැඩ හෝ හැසිරීම අයතුටුදයක වීම නිසා නොව, අන්‍ය වූ හේතූන් නිසා සේවය නවතා ලීමට භාජන වූ අය පහත දක්වෙන අනුග්‍රහය ලැබීමට සුදුස්සෝ වෙති :—

4 වැනි ඡේදයෙහි (iv) කොටසෙහි දක්වුණු වයස් සීමාව ගණන් බැලීමේ දී සේවයෙන් පහකරනු ලැබීමෙන් හෝ වැඩ අසතුටුදයක වීමේ හේතුවෙන් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ආණ්ඩුවේ සේවයෙන් අස්වුණු අය හැර අන්‍යයන්ට තමන් ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටි කාල සීමාව තම වයසින් අඩු කර ගැනීමට අවසර දෙනු ලැබේ.

7. **සුදුසුකම් : රජයේ සේවකයන්ට විශේෂ අනුග්‍රහ.**—(i) **අර්ධ ලිපිකාර සේවයේ ලිපිකරුවෝ.**—1964 අප්‍රේල් මස 1 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් ස්ථිර කරන ලද පත්වීම් ඇත්තා වූ ද, 1964 මැයි මස 1 වැනි දිනට අවුරුදු 45ට නොවැඩි වූ ද අර්ධ ලිපිකාර සේවයේ ලිපිකරුවන් ට අධ්‍යාපන සුදුසුකම් ගැන නොසලකා මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මෙම විභාගයෙන් සාමාර්ථය ලබන ඉහත සඳහන් වර්ගයට අයත් වන, 1956 සැප්තැම්බර් මස 24 වැනි දිනට පළමුව පත් කරන ලද නිලධාරීන්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා " ආදි ප්‍රවේශකයින් " ලෙස සලකනු ලැබේ.

(ii) **දිස්ත්‍රික්ක ලිපිකරුවෝ, පිටපත් කරන්නෝ සහ යතුරු ලිවීමේ ලිපිකරුවෝ.**—භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ගේ පාලනය යටතේ පවත්නා ආණ්ඩුවේ දිස්ත්‍රික්ක ලිපිකාර සේවයේ නියුක්ත 1964 අප්‍රේල් මස 1 වැනි දින හෝ ඊට ප්‍රථම ස්වකීය දිස්ත්‍රික්ක ලිපිකාර පදවි ස්ථිර කරනු ලැබ සිටින ලිපිකරුවන් ට ද, 1964 අප්‍රේල් මස 1 වැනි දිනට දෑවුරුද්දකට නො අඩු ස්ථිර සේවයක් ඇති පිටපත් කරන්නන්ට සහ යතුරු ලිවීමේ ලිපිකරුවන්ට ද 1964 මැයි මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45 ට නොවැඩි නම් අධ්‍යාපන සුදුසුකම් ගැන නො සලකා මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මෙම විභාගයෙන් සාමාර්ථය ලබන, ඉහත සඳහන් වර්ගවලට අයත් වන, 1956 සැප්තැම්බර් මස 24 වැනි දිනට පළමුව පත් කරන ලද නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා " ආදි ප්‍රවේශකයන් " වශයෙන් සලකනු ලැබේ.

(iii) **ස්ථිර සේවකයෝ.**—රජයේ සේවයෙහි ස්ථිර තනතුරු දරන එහෙත් 7 වැනි ඡේදයේ (i) වැනි හා (ii) වැනි කොටස් යටතේ දෙනු ලබන අනුග්‍රහයන්ට සුදුසුකම් ලබා නොමැති පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :—

(අ) 1964 අප්‍රේල් මස 1 වැනි දිනට සේවයෙහි යෙදී සිටින පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 4 වැනි ඡේදයේ (iii) වැනි කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතු ය.

(ii) 1964 මැයි මස 1 වැනි දිනට වයස අවුරුදු 45ට නො වැඩි විය යුතු ය.

(iii) යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරා ගනු ලැබුවහොත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තු වලින් ඔවුන් මුද හැරීමට කැමති විය යුතු ය.

(ආ) 1964 අප්‍රේල් මස 1 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු හතරක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත වූ අය :—

(i) ඔවුන් පහත දක්වා ඇති විභාගවලින් යටත් පිරිසෙයින් එකකින් සාමාර්ථය ලබා සිටිය යුතු ය :—

(ආ) කේම්බ්‍රිජ් ජූනියර් සහතිකය ;

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කණිෂ්ඨය සහතිකය ;

(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පාඨශාලාවක කණිෂ්ඨ සහතිකය.

(ii) 1964 මැයි මස 1 වැනි දින ට වයස අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය.

(iii) යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරා ගනු ලැබුවහොත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තු වලින් ඔවුන් මුද හැරීමට කැමැති විය යුතු ය.

**සංලක්ෂ්‍යය.**—(අ) මෙම විභාගයෙන් සාමාර්ථය ලබන ඉහත දක්වුණු (අ) සහ (ආ) වර්ගවලට අයත් වන, 1956 සැප්තැම්බර් මස 24 වෙනි දිනට පළමුව පත් කරන ලද නිලධාරීන් රජයේ භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා " ආදි ප්‍රවේශකයන් " වශයෙන් සලකනු ලැබේ.

(ආ) 7 වැනි ඡේදයේ (iii) (අ) සහ (ආ) කොටස් යටතේ දුම්රිය තැපැල්, මිනුම්දෝරු, ආරෝග්‍යශාලා හා රේගු වැනි දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන්ට අයත් නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට නො හැකි වේ. එසේ වුව ද, දැනට නිලධාරීන් බඳවා ගැනීම නවකා ඇති දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන් හි නියුක්ත ව සිටින ලිපිකරුවන්ට මෙම විභාගයට පෙනී සිටීමට අවසර තිබේ.

(iv) **තාවකාලික සේවකයෝ.**—රජයේ සේවයෙහි තාවකාලික තනතුරු දරන පහත සඳහන් (අ) සහ (ආ) වර්ග වලට අයත් නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :—

(අ) 1964 අප්‍රේල් මස 1 වැනි දිනට අනන්තර පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුද්දක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 4 වැනි ඡේදයේ (iii) වැනි කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතු ය.

(ii) 1964 මැයි මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය.

(ආ) 1964 අප්‍රේල් මස 1 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු 4ක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 7 (iii) වැනි ඡේදයේ (ආ) (i) කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතු ය.

(ii) 1964 මැයි මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය.

8. **අයදුම් පත්.**—(i) 1964 අප්‍රේල් මස 14 වැනි දින සිට අප්‍රේල් මස 17 වැනි දින දක්වා කාල සීමාව තුළ විභාග දෙපාර්තමේන්තුවේ විමසීම් කාර්යාලයට පෞද්ගලික වශයෙන් පැමිණ හෝ 1964 අප්‍රේල් මස 2 වැනි දින සිට අප්‍රේල් මස 8 වැනි දින දක්වා '' කොළඹ 2, මැලේ වීදිය, තැපැල් පෙට්ටිය 1503', විභාග කොමසාරිස් '' යන ලිපිනයට ලියා තැපැල් මගින් ඉල්ලුම් කිරීමෙන් හෝ විභාගයට පෙනී සිටීම සඳහා අයදුම් පත් ලබා ගත හැක. එක් විභාගාපේක්ෂකයකුට දෙනු ලබන්නේ එක් අයදුම් පතක් පමණකි.

මෙම විභාගය සඳහා අයදුම් පත් තැපැල් මගින් ඉල්ලුම් කරන සෑම අයකු විසින් ම තමන් ගේ ලිපිනය හා වම්පස ඉහළ කෙළවරේ මෙම විභාගයේ නම ද ලියන ලද තැපැල් මුද්දර නො ඇලවූ දිග ලියුම් කවරයකුත් සමඟ එසේ ඉල්ලුම් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. එසේ කිරීමෙන් විභාග දෙපාර්තමේන්තුවට එම අයදුම් පත ඔහු වෙත හෝ ඇය වෙත කඩිනමින් එවීමට හැකි වනවා ඇත.

විභාග කොමසාරිස් ගේ හෝ අන්‍ය නිලධාරියකු ගේ පුද්ගලික ලිපිනයට අයදුම් පත් ඉල්ලා නො එවිය යුතු ය.

(ii) අයදුම් පත් 1964 අප්‍රේල් මස 18 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් කොළඹ 2, මැලේ වීදිය, තැපැල් පෙට්ටිය 1503, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

එම දිනට පසුව ලැබෙන ඕනෑම අයදුම් පතක් භාරගනු නො ලැබේ. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම හා තමා විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානය පැහැදිලිව සඳහන් කළ යුතු ය. (විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන මෙහි 1 වැනි ඡේදයෙහි දක්වෙයි).

(iii) නියමානුකූලව අවලංගු කළ රුපියල් 20ක මුද්දර අයදුම් පතෙහි අලවා තිබිය යුතු ය.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයන් විසින් එවනු ලබන අයදුම් පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. 6 වැනි ඡේදය යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් විසින් සිය අයදුම් පත් එවිය යුත්තේ ඔවුන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙනි. එසේ නො කරන කිසියම් අයදුම් කරුවෙකු වෙතොත් ඔහු විභාගයට නුසුදුස්සෙකු කොට සලකනු ලැබේ. 1964 අප්‍රේල් මස 18 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමකුත් සමඟ ස්වකීය අයදුම් පත් තමන් ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම් කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ.

විභාග කොමසාරිස් ගේ හෝ අන්‍ය නිලධාරියෙකු ගේ පුද්ගලික ලිපිනයට අයදුම් පත් නොඑවිය යුතු ය.

9. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම් කරුවන් විසින් තමන් ගේ ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර පරිපාලන නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශපත්‍රයක් ඉදිරිපත් නො කරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ඉල්ලුම් කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුතු ය. තමාට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාග ශාලාවක දී කිසිම අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ප්‍රවේශ පත්‍රය සමඟ කාල සටහනෙහි පිටපතක් ද අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා පන්තියක් ද අපේක්ෂකයන් වෙත යවනු ලැබේ. අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථාවන් පිළි පැදීමට බැඳී සිටිති. විභාගයට පෙනී සිටින්නා වූ සෑම අපේක්ෂකයකු විසින් ම විභාගය පවත්වන දිනයෙහි ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග පරිපාලක වෙත භාර දිය යුතු යි.

යම්කිසි ඉල්ලුම් කරුවකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් සත් දවසකට කලින්) තමා ගේ ප්‍රවේශ පත්‍රය නො ලැබුණොත් ඔහු විසින් ඒ බව වහාම—

'' කොළඹ 2,<br>
තැපැල් පෙට්ටිය 1503,<br>
මැලේ වීදිය,<br>
විභාග කොමසාරිස් තැන. ''

යන ලිපිනයට දැනුම් දිය යුතු යි. (විදුලි පණිවුඩ යවන ලිපිනය : '' විභාග '' කොළඹ කියා වේ.) ප්‍රවේශ පත්‍රය නො ලැබුණ බව විභාග කොමසාරිස් වරයාට දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතු යි :—

(1) විභාගයේ නම : ————.

(2) සම්පූර්ණ නම : ————.

(3) සම්පූර්ණ ලිපිනය : ————.

(4) විභාග මධ්‍යස්ථානය : ————.

(5) තැපැල් කන්තෝරුව, ලියා පදිංචි කළ අංකය සහ අයදුම් පත තැපැල් කල දිනය : ————.

(ii) **විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නො කළ යුතුයි.**

විභාග කොමසාරිස් තැනට ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයෙකු ට තාවකාලිකව විභාගයට පෙනී සිටීම පිණිස තාවකාලිකව අවසර දිය හැකි ය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

10. **හැඳින්වීමේ පත්‍ර.**—විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකු විසින් ම විභාග ශාලාවේ දී විභාග පරිපාලක ගේ සතුටට හේතුවන පරිදි සෑම විෂයයක් පාසාම ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් ඕනෑම එකක් භාර ගනු ලැබේ.

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත්‍ර ;

(ආ) විභාග දිනයට අවුරුදු 3 කට නොවැඩි කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු ගමන් අවසර පත්‍රයක් (පාස් පෝට් බල පත්‍රය) ;

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ පොදු සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරීත්වය යටතේ නිකුත් කරන ලද, අයිතිකරු ගේ ඡායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ආ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක්.

පසුපිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ———————— (අයදුම් කරු ගේ සම්පූර්ණ නම) යන අයගේ බව මම සහතික කරමි.

.....................................

අයදුම්කරුගේ පුරුදු අත්සන.

.....................................

අයදුම් කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

.....................................

(නම සහ තරාතිරම).

දිනය : .....................................

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නො හැකි ඉල්ලුම්කරුවකු ගේ අපේක්ෂකත්වය තාවකාලික ය. එම අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකි ය.

11. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) අයදුම් පත සමඟ වෙන කිසිම ලිපි ලේඛනාදියක් නො එවිය යුතු ය. එහෙත් නියමකොට ඇති පරිදි අවශ්‍ය සියලුම විස්තර අයදුම් පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන සියළුම කරුණු වලින් සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍රයක් වුවහොත් එය එහිම කුශලතා උඩ සලකා බලා ප්‍රතික්ෂෙප කරන්නට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලද අපේක්ෂකයන් විසින් තමන්ගේ යෝග්‍යතාව, ලියකියවිලි වලින් ඔප්පු කළ යුතු ය. එබඳු වූ අපේක්ෂකයන් එම ලිය කියවිලි, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙනොත් එම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම හෝ නො එසේනම් විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාදව ලියාපදිංචි කළ තැපැලෙන් යැවීම හෝ කළ යුතු යි.

(iii) පහත දක්වෙන ලියකියවිලි අවශ්‍යය :—

(අ) යහපත් චරිතය පිළිබඳ වග කිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවකින් ලහදී අස් වී හෝ සිටී නම් චරිත සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්ය වරයාගෙනි. නො එසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාර යෙක්, අධිනීතිඥයෙකෙනෙක්, නීතිඥ කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 2,400 ක් හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකට ව, දන්නා, කෙළින් ම තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන්වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තා ගේ පදවි නාමය, නම හා ලිපිනය ද එහි පැහැදිලි සේ සඳහන්ව තිබිය යුතු ය.

ආණ්ඩුවේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක්; හෝ (උප්පැන්නය ලියා පදිංචි නොකළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්, කිසියම් අපේක්ෂකයෙකුහට ඉදිරිපත් කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම් එම අපේක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සලකනු ලබන්නේ සහතික යේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙසට ය.

**සංලක්ෂ්‍යය.**—(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙන් උපුටාගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නො ලැබේ.

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවිරුම් සහතික පත්‍ර හෝ බව්තීස්ම සහතික පත්‍ර හෝ භාර ගනු නො ලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දක්වෙන නම/නම් හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ අඥපණතේ (110 වැනි පරිච්ඡේදයේ) අංක 27 හෝ 28 හෝ දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්නයෙන් දක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ ප්‍රකාර ස්වකීය නම් වෙනස් කළ දනට ආණ්ඩුවේ තනතුරු දරණ අපේක්ෂකයන් උප්පැන්න සහතිකයේ ද තමන්ගේ නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතික පත්‍රයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් ආණ්ඩුව මගින් පිළිගත් බව දක්වෙන සහතිකයක් (උචිත වන පරිදි).

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත්කොට නැතහොත් ඊට අදාල වූ වෙනත් රාජකාරී ලියවිල්ලක් (උද හරණය.—පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්).

(ඉ) හේවා පන්නයට අයත් නොවූ සේවකයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතිකය හෝ යුද හමුදවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 5 වැනි ඡෙදයෙහි දක්වුණු අපේක්ෂකයන් සම්බන්ධයෙනි).

(ඊ) ආණ්ඩුවේ සේවය පිළිබඳව ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 6 වැනි ඡෙදයෙහි දක්වුණු අපේක්ෂකයන් සම්බන්ධයෙනි).

(උ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ සඳහා ද මෙය රැගෙන ආ යුතු ය.).

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ දී වුවමනා සියලුම ලියකියවිලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වෙතොත් ඒ අවස්ථාවේ දී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන්නට අපොහොසත් වන හෝ විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයකු වෙතොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. **අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ රෙගුලාසි අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පැවැත් වෙද්දී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකියි.

අපේක්ෂකයෙකු විසින් ඔහු දැනුවත්වම අසත්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් සිතා මතාම යටපත් කළබවක් හෝ එසේ නැතහොත්, ඔහු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකුව සිටි බව ඔහුගේ සේවා කාළය තුළ කිසියම් අවස්ථාවකදී ඔප්පු වුවහොත් ඔහු වහා සේව යෙන් පහ කිරීමට හේතු වනු ඇත.

13. **මුදල් ආපසු ගෙවීම.**—කිසිම කරුණක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නො ලැබේ. මෙම විභාගය වෙනුවෙන් ගෙවන ලද ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කළ හැකි නොවේ.

14. **රජයේ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—විභාග කොමසාරිස් විසින් අනුමත කරන ලද අයදුම් පත් ඇති, රජයේ නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිවාඩු (රාජකාරි නිවාඩු නොවේ) දිය යුතු ය.

15. **විභාග පරිපාටිය.**—විභාගය පවත්වනු ලබන්නේ කොටස් දෙකක් වශයෙනි. එනම්, I වැනි කොටස (ලිඛිත පරීක්ෂණය) සහ II වැනි කොටස (සම්මුඛ පරීක්ෂණය). විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයය වෙනුවෙන් නියමිත ලකුණු පහත දක්වේ. නරක අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ. නො පැහැදිලි අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ.

## I වැනි කොටස—(ලිඛිත පරීක්ෂණය)

**(අ) අනිවාර්ය විෂයයෝ**

| | ලකුණු |
|---|---|
| (1) සිංහල වාක්‍ය රචනය—පැය 1 යි ... ... ... ... | 100 |
| (2) සිංහල යතුරු ලිවීම—අඩුම වේගය විනාඩියකට වචන 20 බැගින් ටයිප් ගැසීම විනාඩි 20 යි ... | 150 |

**සැලකිය යුතුයි.**—(i) පරීක්ෂණය පැවැත්වෙන දින දී ප්‍රයෝජනය සඳහා තමන් ගේ ම යතුරු ලියන යන්ත්‍ර රැගෙන ආ යුතු ය.

(ii) එසේ කළ නො හැකි අපේක්ෂකයන් ට තම තමන් අතරේ එක යතුරු ලියන යන්ත්‍රයක් පාවිච්චි කිරීමට පිළියෙළ කර ගැනීමට ඉඩ දෙනු ලැබේ. එක් දිනක දී එක යතුරු ලියන යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙළ කර ගන්නා අපේක්ෂකයන් ගේ ගණන හතරකට වැඩි විය යුතු නොවේ. එසේ කරන අපේක්ෂකයන් ඔවුන් අතුරෙන් පළමුවෙන් යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අපේක්ෂකයාට නියම දිනයෙහි දී විභාගය පවත්ගැනීමට ප්‍රථම විභාග මධ්‍යස්ථානයේ පරිපාලන නිලධාරියා වෙත දනුම් දිය යුතු යි. එක් එක් අපේක්ෂකයාට නියම වී ඇති දිනය නොතකා එම අපේක්ෂකයන් සියල්ලම එක දිනයෙහි ම විභාග මධ්‍යස්ථානයේ පරිපාලන නිලධාරියා පරීක්ෂණය කරනවා ඇත. ඒ සම්බන්ධව යොදගෙන ඇති වැඩ පිළිවෙළ පිළිබඳව අපේක්ෂකයන් විසින් අන් දන්වීමක් දීම වුවමනා නොවේ.

(iii) මෙම විභාගය සඳහා පෙනී සිටින, 1964 මැයි මස 22 වැනි දිනවන විට සිය පත්වීම් ස්ථිර කර ඇති රජයේ සියළුම නිලධාරීන් ට තමන්ගේ විභාග ශාලාව වෙත කාර්යාලයීය යතුරු ලියන යන්ත්‍ර රැගෙන යාමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවසර දෙනු ලැබේ. එහෙත් මෙම අනුග්‍රහයෙන් ප්‍රයෝජනය ගන්නා සෑම නිලධාරියෙකු ගෙන්ම යතුරු ලියන යන්ත්‍ර සුරක්ෂිතව ආපසු භාරදෙන බවටත් ඒවා පරිහරණය කිරීමේ දී සිදුවන අලාභ හානි ආදියක් වෙතොත් ඒවාට වගකියන බවටත් ලිඛිත ප්‍රකාශයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ලබා ගත යුතු ය.

(iv) ඉහත (ii) ඡෙදය යටතේ දී ඇති අවසරය හැරුණු විට තමාගේ යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා අපේක්ෂකයෙකු හට දී තිබෙන දිනයෙහි වෙනසක් කර ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීමකට සාමාන්‍යයෙන් ඉඩ දෙනු නො ලැබේ.

(v) විභාග කොමසාරිස් විසින් විභාග ශාලාවේදී යතුරු ලියන යන්ත්‍ර සපයනු නො ලැබේ.

(vi) ටයිප් ගසන ලද පත්‍රිකා හරි වැරදි බැලීමේ දී නිසි ශෝභන පිළිවෙල, නිරවද්‍යතාව සහ වේගය ගණන් ගනු ලැබේ.

| | ලකුණු |
|---|---|
| (3) සාමාන්‍ය දැනීම :—විනාඩි 30 යි ... ... ... ... ... | 50 |
| (ආ) වෛකල්පිත විෂයය | |
| (4) සිංහල ලඝු ලේඛනය (විනාඩියකට වචන 50 බැගින්) ... ... ... | 50 |

**සැලකිය යුතුයි.**—(i) මෙම විෂයය ගැනීමෙන් ලබන ලකුණු වලින් වාසියක් නො වන නිසා විභාගාපේක්ෂකයන්ට මෙම විෂයය ගැනීම හෝ නො ගැනීම කළ හැකි. එහෙත් ලඝු ලේඛනය දන්නා විභාගාපේක්ෂකයන්ට මෙම විෂයය ගන්නා ලෙස උපදෙස් දෙනු ලැබේ.

(ii) ලඝු ලේඛනය පිළිබඳ පරීක්ෂණය සඳහා අපේක්ෂකයෙකු හට දී තිබෙන දිනයෙහි වෙනසක් කර ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීමකට සාමාන්‍යයෙන් ඉඩ දෙනු නො ලැබේ.

## II වැනි කොටස

| | ලකුණු |
|---|---|
| **සම්මුඛ පරීක්ෂණය** ... ... ... ... | 50 |

පළමුවෙන් පවත්වනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයයි. එහි ප්‍රතිඵල අනුව අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා තරඟ ක්‍රමයකට තෝරා ගන්නවා ඇත. කොළඹදී පවත්වනු ලබන මේ සම්මුඛ පරීක්ෂණ යේ දිනය ඔවුන්ට කල්තියා දනුම් දෙනවා ඇත. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු ගණන නියම කරනු ලබන්නේ විභාග කොමසාරිස් ගේ ද අදහස් විමසා ක්‍රියා කරන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසිනි. සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් දක්වන අපේක්ෂකයන් ගේ ගණන, පුරප්පාඩු ගණනට වඩා අඩුවුවහොත් සම්මුඛ පරීක්ෂණය නො පැවැත්වීමට ඉඩ තිබේ.

16. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ පත්වීම් දීම.**—සමර්ථ වන අපේක්ෂකයන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කර සුදුසු පුරප්පාඩු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනවා ඇත.

17. **වෛද්‍ය පරීක්ෂණය.**—පත්වීම් දීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්තබවට වෛද්‍ය පරීක්ෂණයකින් ද සාමාර්ථය ලැබිය යුතු යි.

18. මේ ව්‍යවස්ථාවලින් විස්තර නො කරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් මේ නම් එය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

කීර්ති වීරක්කොඩි,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙනුවටය.

1964 මාර්තු මස 20 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ සිංහල විභාගය—1964 මැයි*

විභාග අංකය :.......................

(කාර්යාලයීය පාවිච්චිය සඳහා පමණයි.)

### අයදුම් පත

(අයදුම් පත පිරවීමට පෙර 5 වැනි පිටුවේ ඇති උපදෙස් බලන්න).

1. (අ) ඔබේ පුරුදු අත්සන ...

මුල් අකුරු සහිත ඔබේ නම (පැහැදිලි අකුරින්) ...

සියළුම නම් සම්පූර්ණයෙන් (මහත්මයා/මහත්මී/මෙනෙවිය යන වග සඳහන් කරන්න.) ...

(ආ) සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයන් විසින් ස්වකීය කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුයි.)

2. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානය (සාමාන්‍යයෙන් අපේක්ෂකයා පදිංචි ස්ථානයට කිට්ටුම ස්ථානය)

| පළමුවන තේරීම | දෙවන තේරීම |
|---|---|
| | |

3. (අ) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—

(i) පරම්පරාව නිසා ද නැතහොත්,

(ii) ලියාපදිංචි කිරීම නිසා ද යන වග ...............

(ආ) උපන් ස්ථානය :—

(i) අපේක්ෂකයා :.......................................

.......................................

(ii) අපේක්ෂකයාගේ පියා :.......................................

.......................................

(iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ ආතා :.......................................

.......................................

(iv) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තා :.......................................

.......................................

සැලකිය යුතුයි. — අපේක්ෂකයා සහ ඔහුගේ පියා යන දෙදෙනාම උපන්නේ ලංකාවේ නම් (i) සහ (ii) පමණක් පිරවීම සෑහේ. අපේක්ෂකයා හෝ ඔහුගේ පියා උපන්නේ ලංකාවේ නොවේ නම්, (i), (ii), (iii) සහ (iv) යන සියල්ලම පිරවිය යුතුයි.

| | අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|---|
| 4. (අ) ඔබ උපන් දිනය ... ... | ................ | ................ | ................ |
| (ආ) 1964.................වැනි දිනට ඔබේ වයස (අවුරුදු හා මාස වලින්) | ................ | ................ | ................ |

*1964 මාර්තු මස 26 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය බලන්න.

5. හේවාවසමට අයත් නොවන අයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියේ සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ විස්තර දක්වන්න ...

| ආයතනයේ නම | දරු පදවිය හෝ ධුරය | දින: සිට | දින: දක්වා | කාලය: අවුරුදු | කාලය: මාස | අස්කරනු ලැබීමට හේතු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | එකතුව ... | | | |

6. ඔබ යුද, හමුදවන්හි යෙදී සිට සේවාමුක්ත වූවෙක් නම්, නිත්‍ය හට හමුදවෙහි ඔබ විසින් කරන ලද සේවය පිළිබඳ විස්තර දක්වන්න ... ...

| සේනාංකයේ නම | නිලය | දින: සිට | දින: දක්වා | කාලය: අවුරුදු | කාලය: මාස | සේවාවෙන් අස්වීයාමට හේතු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | එකතුව ... | | | |

7. විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 6 වැනි ඡෙදය යටතේ දක්වෙන පරිදි නිලධාරීන් සංඛ්‍යාව අඩුකිරීම සඳහා අස්කරන ලද ආණ්ඩුවේ සේවකයන්ට දෙනු ලබන විශේෂ අනුග්‍රහය යටතේ නම්, ආණ්ඩුව යටතේ ඔබ විසින් කරනලද සේවය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මෙහි දක්වන්න ...

| දෙපාර්තමේන්තුව | දරු පදවිය | ස්ථිරවද නැතහොත් තාවකාලික වද යන වග | දින: සිට | දින: දක්වා | කාලය: අවුරුදු | කාලය: මාස | සේවාවෙන් අස්වීයාමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | එකතුව ... | | | |

8. විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 7 වැනි ඡෙදය යටතේ දක්වෙන පරිදි ආණ්ඩුවේ ස්ථිර හෝ තාවකාලික හෝ තනතුරු දරන්නන්ට දෙනු ලබන විශේෂ අනුග්‍රහ යටතේ නම් පහත දක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දක්වන්න :

(අ) ඔබ අයත් වන්නේ 7 වැනි ඡෙදයේ දක්වෙන කොටස් අතුරෙන් කවර කොටසකට ද ? ...

(ආ) දරණ තනතුර ... ...

(ඉ) එම තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලික ද ? ... ...

(ඊ) දෙපාර්තමේන්තුවේ නම ...

(උ) සේවා කාලය (දින සහිතව) ...
(ඔබේ සේවා කාලය තාවකාලික හා ස්ථිර යන දෙවර්ගයටම අයත් වන්නේ නම් ඒවා වෙන් වෙන් වශයෙන් දක්විය යුතුය.)

........................................................වැනි දින සිට
........................................................වැනි දින දක්වා
කාලය : අවු :..................මාස............දවස්............

(ඌ) 1964 මැයි මස 23 වැනි දිනට වයස ...

(එ) ඔබ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ පාලනය යටතේ පවත්නා ආණ්ඩුවේ දිස්ත්‍රික්ක ලිපිකාර සේවාවේ නියුක්ත ලිපිකරුවකු නම් හෝ අර්ධ ලිපිකාර සේවාවේ ලිපිකරුවකු නම් එම පත්වීම ස්ථිර කළ දිනය සඳහන් කරන්න ... ...

(7 (i) සහ 7 (ii) ඡෙද බලන්න).

9. මේ විභාගයට ඇතුලත්වීමට සුදුසුකම් පිණිස අපේක්ෂකයා සමර්ථ වී ඇති විභාගවල තොරතුරු—

(අ) විභාගයේ නම, අවුරුද්ද සහ මාසය ...

(ආ) මධ්‍යස්ථානය ... ...

(ඉ) විභාග අංකය ... ...

(ඊ) පාඨශාලා කණිෂ්ඨ සහතික විභාගය හෝ ඊට සමාන විභාගය හෝ පවත්වන ලද්දේ පාඨශාලාවක් මගින් නම් පහත දක්වෙන විස්තර සපයන්න :

(i) පාඨශාලාවේ නම ... ...

(ii) එහි ලිපිනය ... ...

(iii) එහි පාලනය ... ...

(4 වෙනි පිටුවේ ඇති සහතිකය සම්පූර්ණ කළ යුතුයි.)

10. ආණ්ඩුව යටතේ කළ රක්ෂා ද ඇතුළුව මීට කලින් තමන් විසින් කරන ලද රක්ෂාවන් ද, ඒ ඒ රක්ෂාවල යෙදී සිටි කාලය හා ඒ එක එකකින් අස්වී යාමට හේතු වූ කරුණු ද පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :

(අ) වෙළඳ ආයතනයේ/සේව්‍යයාගේ/ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ නම ...

(ආ) රක්ෂාවේ ස්වභාව ... ...

(ඉ) සේවා කාලය ... ...

(ඊ) එම රක්ෂාවෙන් අස්වී යාමට හේතු වූ කරුණු

| | |
|---|---|
| 11. ඉදිරිපත් කෙරෙන චරිත සහතිකය ලබාගත් තැනැත්තාගේ නම, පදවිය (පදවියක් ඇත්නම්) සහ ලිපිනය | |
| 12. කිසියම් වරදකට ඔබ කවද හෝ වරදකරු කරනු ලැබ තිබෙ නම් හෝ චෝදනා කරනු ලැබ තිබෙ නම් හෝ සිතාසි කරනු ලැබ තිබෙ නම් හෝ ඒ බව සඳහන් කරන්න. එසේ නම්, ඒ දිනය ද, වරදේ ස්වභාව ද, උසාවියේ නම ද, නඩු නොම්මරය ද මෙහි දක්වන්න ... ... | |
| 13. ඔබ පහත සඳහන් වෛකල්පික විෂය ගන්නෙහි ද ?<br>සිංහල ලඝු ලේඛනය ... ... | |

### 9 (ඊ) කොටුවෙහි සඳහන් වූ සහතිකයේ ආකෘති පත්‍රය*

(i) ..............................................................................................................
(පාඨශාලාවේ ලිපිනය)

(ii) ........................................................ (iii) ........................................................
(පාලනය) (පාඨශාලාවේ නම)

පාඨශාලාවේ ප්‍රධානාචාර්ය (iv) ..........................................................................................වන
(ප්‍රධානාචාර්ය තැනගේ නම)

මම අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද මෙම පාඨශාලාවේ ශිෂ්‍යයකු වූ/ශිෂ්‍යාවක වූ* (v) ..................................

..........................................................................................මෙම පාඨශාලාව මගින් පවත්වන ලද
(අයදුම්කරුගේ නම)

(vi) ..........................................................................................විභාගයෙන් සමර්ථ වූ බව සහතික කරමි. මෙම විභාගය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කණිෂ්ඨ සහතික විභාගය හා සමාන ය.

..............................................................
ප්‍රධානාචාර්ය තැනගේ අත්සන.

දිනය : 1964..................................මස.........වැනි දින.

### අපේක්ෂකයා යම්කිසි තැනැත්තකු ඉදිරිපිට දී අත්සන් කරයි ද ඒ තැනැත්තාගේ සහතිකය

(මෙහි අග පෙනෙන සංලක්ෂ්‍යය බලන්න.)

..........................................................................සේවයේ නියුක්ත/පදිංචි..........................................................................

නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1964..................................මස.........වැනි දින ඔහු මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :..................................

නම, පදවිය හා තරාතිරම :..................................

..................................................................

ලිපිනය :..................................

..................................................................

..................................................................

## දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය*

මේ අපේක්ෂකයා විසින් ස්වකීය සේවය සම්බන්ධව 7/8* වැනි කොටුවෙහි සඳහන් කර තිබෙන කරුණු පරීක්ෂාකර බලා එය නිවැරදි බව හෙළි වූ බවත්, ඔහුගේ/ඇගේ* වැඩ කටයුතු හා කල්ක්‍රියාව දිගටම සතුටුදයක/වූ* බවත් රෙගුලාසිවල හැටියට ඔහු/ඇය* මේ විභාගය ගැනීමට සුදුස්සකු බවත් මෙයින් සහතික කරමි.

*තවද, මීට කලින්............................................................................................යන නමින්

හඳුන්වනු ලැබූ මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව,* අංක 394 හා 1957 අගෝස්තු මස 18 වැනි දින දරන භාණ්ඩාගාරයේ වක්‍ර ලේඛනයෙන් සැලසී ඇති

විධිවිධාන අනුව ස්වකීය නම............................................................................යන්නට දැන් වෙනස් කර ඇති බැව් වැඩි දුරටත් සහතික කරමි.

*අපේක්ෂා කරන පදවියට ඔහු/ඇය* තෝරාගනු ලැබුවහොත් දැනට ඔහු/ඇය* සිටින තනතුරෙන් ඔහු/ඇය* මුදලීමට පුළුවන.

..........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවිය : ..........................................

දිනය : 1964..................................මස.........වැනි දින.

---

**සැලකිය යුතුයි.**—(i) මෙම අයදුම් පත පුරවා, 1964 මස වැනි දින හෝ ඊට පෙර, " කොළඹ 2, මැලේ වීදිය, තැපැල් පෙට්ටිය අංක 1503, විභාග කොමසාරිස් " යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. නිවැරදිව ද පහසුවෙන් කියවිය හැකි ලෙස ද අයදුම් පත පිරවිය යුත්තේ අපේක්ෂකයාගේ ම අත් අකුරෙනි. අවශ්‍ය වූ තොරතුරු සියල්ල දී නැත්නම් අයදුම් පත එහි අන්තර්ගත කරුණු උඩ පමණක් විනිශ්වයට භාජන කොට, ප්‍රතික්ෂේප කරන හැකි ය. අයදුම් පත බහා එවන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරෙහි විභාගයේ නම සඳහන් කළ යුතුයි.

(ii) ස්ථිරව හෝ තාවකාලිකව හෝ ආණ්ඩුවේ සේවයෙහි නියුක්තව සිටින අය අයදුම් පත් එවිය යුත්තේ තම තමන් සේවය කරන දෙපාර්තමේන්තු වල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ගැසට් නිවේදනයේ 6 වැනි ඡෙදය යටතේ සුදුසුකම් ඇති බවට හිමිකම් පාන අපේක්ෂකයන් විසින් ඔවුන්ගේ අයදුම් පත් එවිය යුත්තේ, ඔවුන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙනි. එසේ නොකරන අපේක්ෂකයන් විභාගයට සුදුසුකම් නැත්තන් ලෙස සළකනු ලැබේ. මේ අයදුම් පතෙහි තිබෙන සහතික පත්‍රයට දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් අත්සන් තැබිය යුතුයි.

(iii) **මේ අයදුම් පතට ලියකියවිලි නොඇමිණිය යුතුයි.** විභාගයේදී සැළකිය යුතු තත්ත්වයක සමර්ථතාවයක් දැක්වූවන් විසින් පසුව පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු වේ :—

(අ) චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක් ;

(ආ) උප්පැන්න සහතිකයක් ;

(ඉ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ (සුදුසු තන්හි) පරම්පරාවෙන් හිමිවූ පුරවැසි භාවය ඇති බැව් ආණ්ඩුව මඟින් පිළිගත් බව දැක්වෙන සහතිකයක් ;

(ඊ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික ;

(උ) හේවා පන්නයට අයත් නොවූ සේවකයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතිකය හෝ යුද හමුදාවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය ;
(නිවේදනයේ 5 වැනි ඡෙදයෙන් කියැවෙන අපේක්ෂකයන් සඳහා)

(ඌ) ආණ්ඩුවේ සේවය පිළිබඳව ලබාගත් සහතිකය (නිවේදනයේ 6 වැනි ඡෙදයෙන් කියැවෙන අපේක්ෂකයන් සඳහා).
(නිවේදනයේ 11 වැනි ඡෙදය බලනු)

(iv) මේ විභාගයේ රෙගුලාසි අනුව යම් අපේක්ෂකයකු විභාගයට නුසුදුසු බව පෙනී ගියහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ සේ සළකනු ලැබේ. යම් අපේක්ෂකයකු දැන දැනම අසත්‍ය තොරතුරු දී තිබෙන බව පෙනී ගියහොත් එසේ නැතහොත් ඔහු යම්කිසි අවශ්‍ය කරුණක් වුවමනාවෙන්ම යටපත් කර තිබුණොත්, එසේ නැතහොත් ඔහු සේවයට බැඳී සිටින කාලයේ කවර අවස්ථාවක හෝ විභාගයට පෙනී සිටියේ නුසුදුස්සකු හැටියට බව හෙළිවුව හොත් ඔහු වහාම සේවයෙන් පහකිරීමට පිළිවන්කම තිබේ.

*කාරණයට අදාල නොවේ නම් කපා දමන්න/අනවශ්‍ය වචන කපා දමන්න.

මෙහි සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත් මෙයට අලවා ඇත්තේ නිර්ව්‍යාජ වූ ද, එසේම කලින් පාවිච්චි නොකරන ලද්ද වූ ද මුද්දර බවත් මෙයින් දිව්රා සහතික කරමි.

මේ විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමට ද බැඳෙමි. එසේම මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කරන ලද සේ සැලකීමට ඉඩ ඇති බව ද මැනවින් දනිමි.

| |
|---|
| විභාගාපේක්ෂකයා රුපියල් 20 ක් වටිනා මුද්දර මෙහි අලවා ඒ උඩ අත්සන් කළ යුතුයි. |

..........................................................

අපේක්ෂකයාගේ අත්සන.

දිනය : 1964..........................................මස.........වැනි දින.

සංලක්ෂ්‍යය.—අපේක්ෂකයා, ස්ථිර හෝ තාවකාලික වශයෙන්, ආණ්ඩුවේ කාර්‍යාලයක සේවයෙහි නියුක්ත වූවකු නම් ඔහු විසින් හැකි නම් අත්සන් කළ යුත්තේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ඉදිරිපිට ය. අවශේෂ අපේක්ෂකයන් විසින් අත්සන් කළ යුත්තේ සමාදාන විනිශ්වයකාරයකු හෝ ආදායම් පාලක නිලධාරියකු හෝ පෙරකදෝරු කෙනෙකු හෝ නොතාරිස් කෙනෙකු හෝ රුපියල් 2,400 ක් හෝ ඊට ඉහළ වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර සේවයෙහි නියුක්ත නිලධාරියකු හෝ යුද්ධ හමුදාවේ, නාවුක හමුදාවේ හෝ ගගන හමුදාවේ අධිකාරි නිලධාරියකු හෝ ඉදිරිපිට ය.)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1964 අප්‍රේල් මස 23 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට අයත් බේරුවල අළුත් ධීවර වරාය අසළට පස් කියුබ් 150ක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1964 අප්‍රේල් මස 23 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 අප්‍රේල් මස 21 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස්

1964.3.26
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

3–853—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1964 අප්‍රේල් මස 29 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා මාතර පොල්හේන වෙරලබඩ පාරට කළුගල් 1,500ක් සහ සක්කගල් කියුබ් 40ක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1964 අප්‍රේල් මස 29 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කායඹාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 මුදලක් වරාය කොමිෂන් කායඹාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 අප්‍රේල් මස 27 වෙනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

එල්. එස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1964.3.26
කොළඹ, වරාය කොමිෂන් කායඹාලයේදීය.

3–914—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

සායම් සැපයීම සඳහා ඒවා නිපදවන්නන්ගෙන් සහ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 64.5.20 දින පෙරවරු 9.30 දක්වා මිළ ගණන් බාර ගනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සඳහා ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

පී. එච්. පී. ද සිල්වා,
වැඩ බලන ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක.

1964.3.21,
කොළඹ 7,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දී ය.

3–1019—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පේෂකර්ම අත් යන්ත්‍ර උපකරණ තොගයක් සැපයීම සඳහා ඒවා නිපදවන්නන්ගෙන් සහ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 64.5.11 දින පෙරවරු 9.30 දක්වා මිළ ගණන් බාර ගනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සඳහා ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

පී. එච්. පී. ද සිල්වා,
වැඩ බලන ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක.

1964.3.21,
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රයේ දී ය.

3–1021—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගාල්ල උප කොටස

ගාල්ල දිස්ත්‍රික්කයේ, දෙද්දුව ව්‍යාපාරය යටතේ වූ අංක 1 දරණ බෙරණිය ඇලේ 1 වන සහ 2 වන සැතපුම් සුද්ධ කිරීම සඳහා 1964 අප්‍රේල් මස 21 වන අඟහරුවාදා පෙරවරු 10 දක්වා තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් වෙන වෙනම ටැන්ඩර් පත් භාරගනු ලැබේ. ටැන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රු. 43,000 සහ රු. 27,000 ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මෙම කර්මාන්තය සඳහා ටැන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

1964 අප්‍රේල් මස 18 වන සෙනසුරාදා තෙක්, එදින ඇතුලුව, කාර්යාලීය වේලාවන්හිදී ගාල්ලේ හිරිඹුරේ පිහිටි වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් ටැන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුය. ටැන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටැන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා ගාල්ලේ උප කොටස භාර නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම එක් පෝර්මයකට රු. 50.00 බැගින් ටැන්ඩර් තැන්පත් මුදල් උප කොටස භාර නිලධාරි තැනගේ කාර්යාලයෙහි හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි සමුපකාර සමිතිවලින් පමණක් ටැන්ඩර් තැන්පත් මුදල් අය කරනු නොලැබේ. කෙසේ වෙතත් එම සමිති මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් හැටියට ලියාපදිංචි වී සිටිය යුතුය.

මෙම ටැන්ඩර් පිළිබඳ සියලු විස්තර, වැඩ පිළිබඳ සැලසුම් හා වෙනත් විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී උප කොටස භාර නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

අ. ඇෆ්. මහගමගේ,
උප කොටස භාර නිලධාරි තැන,
ගාල්ල උ. කො.

වාරිමාර්ග කාර්යාලයය,
ගාල්ල, 1964.3.18.

3–932—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ත්‍රිකුණාමලය උප කොට්ඨාසය

64.2.21 වැනි දින අංක 13,956 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළමුවෙනි කොටසෙහි දෙවැනි ඡේදයෙහි (දැන්වීම්) පළ කරන ලද සුංගන්කුලම යථා තත්ත්වයට පැමිණවීම පිළිබඳ ටෙන්ඩරයෙහි, ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය 64.4.14 දින පෙරවරු 10 දක්වාත්, ටෙන්ඩර් පත් නිකුත් කරණ අවසාන දිනය 64.4.10 දින දක්වාත් දීර්ඝ කර ඇති බැව් මෙයින් දැනුම් දෙමි.

වී. ඇස්. වේලුපිල්ලෙ,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
ත්‍රිකුණාමලය උප කොටස.

3-992—64.3.26 දින අංක 13.996 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මන්නාරම උප කොටසේ මෝදරගම ආරු ඇල සෑදීම සඳහා, අංකය 13,956 හා 64.2.21 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍ර නිවේදනයෙන් කැඳවන ලද ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන දිනය, 1964.4.21 දින දක්වා මෙයින් දීර්ඝ කර ඇත.

1964.4.17 දින දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක.

එන්. පෙරියතම්බි,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1964 මාර්තු මස 19 වෙනි දින,
කොළඹ දීය.

3–948—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගාල්ල උප කොටස

ගාල්ල දිස්ත්‍රික්කයේ, දෙද්දුව ව්‍යාපාරය යටතේවූ අංක 2 දරණ බෙරණිය ඇල සුද්ධ කිරීම සඳහා 1964 අප්‍රේල් මස 21 වන අඟහරුවාදා පෙරවරු 10 දක්වා තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් පත් භාරගනු ලැබේ. ටැන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 42,000.00 ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේම කර්මාන්ත සඳහා ටැන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

1964 අප්‍රේල් මස 18 වන සෙනසුරාදා තෙක්, එදින ඇතුලුව, කායඝිල වේලාවන්හිදී ගාල්ලේ හිරිඹුරේ පිහිටි වාරිමාර්ග කායඝිල යෙන් ලබා ගත හැකි පෝර්මවල පමණක් ටැන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුය. ටැන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටැන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටැන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා ගාල්ලේ උප කොටස භාර නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම එක් පෝර්මයකට රු. 50 බැගින් ටැන්ඩර් තැන්පත් මුදල් උප කොටස භාර නිලධාරි තැනගේ කායඝිලයෙහි හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියා පදිංචි සමූපකාර සමිතිවලින් පමණක් ටැන්ඩර් තැන්පත් මුදල් අය කරණු නොලැබේ. කෙසේ වෙතත් එම සමිති මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් හැටියට ලියා පදිංචි වී සිටිය යුතුය.

මෙම ටැන්ඩර් පිළිබඳ සියලු විස්තර, වැඩ පිළිබඳ සැලසුම් හා වෙනත් විස්තර යනාදිය කායඝිලීය වේලාවන් තුලදී උප කොටස භාර නිලධාරි තැනගේ කායඝිලයෙන් ලබා ගත හැක.

අ. ඇෆ්. මහගමගේ,
උප කොටස භාර නිලධාරි තැන,
ගාල්ල උ. කො.

වාරිමාර්ග කායඝිලයය,
ගාල්ල, 1964.3.18.

3–941—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහකනදරාව උප කොටස

මහකනදරාව ව්‍යාපාරයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත් 1964 අප්‍රේල් මස 7 වැනි දින පෙරවරු 11 දක්වා අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

1. එම්. කේ. එල්. 1—දකුණු ඉවුරේ 4 වැනි යායේ 5 සැත. දම්වැල් 37 සිට 6 සැතපුම. 20 දම්වැල් දක්වා ප්‍රධාන ඇල කැපීම. රු. 22,000.

2. එම්. කේ. එල්. 2—දකුණු ඉවුරේ 4 වැනි යායේ බෙදාහැරීමේ සහ කුඹුරු ඇලවල් කැපීම. රු. 44,000.

3. එම්. කේ. එල්. 3—පරංගිවාඩිය වැවේ අඩි 150 ක වාන සෑදීම. රු. 21,000.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් පත් වල වෙන වෙනම ඉහත සඳහන් කර ඇති ගනන්වලට හෝ ඊට වැඩි ගනන්වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

1964 මාර්තු මස 28 වැනි දින සිට 1964 අප්‍රේල් මස 3 වැනි දින තෙක් කායඝිල වේලාවන් තුලදී, මිහින්තලේ, මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝිලයෙන් ලබාගත හැකි, පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගෙ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම් දක්වන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඇම්. කේ. එල්. 1 සහ 2 රු. 50 ක සහ ඇම්. කේ. ඇල් 3 ට රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

මේ ටෙන්ඩර් ගැන සියලුම විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ක. කනගසුංදුම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහකනදරාව උප කොටස.

1964 මාර්තු මස 17 වැනි දින,
මිහින්තලේදී.

3–1001—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### අනුරාධපුර උප කොට්ඨාශය

අනුරාධපුර උප කොට්ඨාශයේ ඒ. එල්. 1 බෙලිගමුව.-නිලාගම-දේවනුවර පාරේ ගල් සහ තාර දැමීම සඳහා ටැන්ඩර් පත් 1964 අප්‍රේල් මස 21 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා උතුරු මැද කොට්ඨාසේ අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටැන්ඩර් විවෘත කිරීම එහිදී එදිනම කරනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 44,000 කට හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

3. වෂී 1964 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා වනතෙක් (එදින ඇතුළුව) කායඝිලයීය වේලාවන් තුලදී අනුරාධපුර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝිලයෙන් ලබාගතහැකි පෝර්මවල පමණක් අයදුම් පත් ඉදිරිපත්කල යුතුයි. ටෙන්ඩර් පෝර්ම කොල සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ඉල්ලුම් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර කිරීමට ඉඩ තිබේද නැද්ද යන්න ගැණ සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැනවෙත ඉදිරිපත් කල යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝිලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුයි.

4. මේ සම්බන්ධයෙන් ගිවිසුම, වැඩ සැලසුම්, ආදී වැඩි විස්තර කායඝිල වේලාවන් තුලදී වාරිමාර්ග ඉන්ජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

කේ. බී. ඊ. ද එස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අනුරාධපුරය උ. කො.

1964 මාර්තු 9 වන දින.

3–943—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගේ හා විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කොන්ත්‍රාත් කරුවන් හැටියට ලියා පදිංචි වී ඇති අනිකුත් සමුපකාර හා කොන්ත්‍රාත් කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(1) සුදු ඇල ශුද්ධ කිරීම—පොල්වත්ත.

(2) කොබෙයිතුඩුව ඇල ශුද්ධ කිරීම—බටපොල බටගිර.

(3) රත්ගහකරාවේ ඇල ශුද්ධ කිරීම—වේරගොඩ, කුලීගොඩ.

(4) කිරලගහ ඇල ශුද්ධ කිරීම—වේරගොඩ, කුලීගොඩ.

(5) කළුගල ඇල සොරොව්වේ ලෑලි සෑපයීම—වතුරවිල, පැලැගස් පලාත.

(6) දෙවල්කනේ අමුණ අළුත්වැඩියා කිරීම—අමුගොඩ.

(7) මහ ඕකන්දයාය අමුණ අළුත්වැඩියා කිරීම—ඉදිපලේගොඩ.

(8) මඳුරු දූව ගලපාත බන්ඩ් එක අළුත්වැඩියා කිරීම—මහ හැගොඩ.

(9) අක්මීමන අමුණේ සිට පයිප්ප බෝක්කුවක් හා ගල්කාණුවක් තැනීම—ඉහලගොඩ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ ගාළු දිස්ත්‍රික්කයේම ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත් ආකෘති පත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1964 මාර්තු මස 28 වැනි සෙනසුරාද සිට 1964 අප්‍රේල් මස 6 වැනි දින දවල් 12 දක්වා ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම් වලින් මෙන්ම වචන වලින්ද දැක්විය යුතුය. මිල ගණන් සහ ප්‍රමාණයන් ගණිතානුකූලවද, නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන් වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට දින යොදා සීල් තබන ලද ලියුම් කවර වල බහා, ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩු වම් කෙලවරේ "සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 7 වැනි දින දවල් 12ට පෙර, ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි ලියා පදිංචි කල තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරා ගත් ටෙන්ඩර් කරුට ඒ බව ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට දස දිනක් ඇතුලතදී එම ටෙන්ඩර් කරු විසින් ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 10ක් ටෙන්ඩර් කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කල පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත්වන ලෙස තෝරා ගත් ටෙන්ඩර් කරුට දැන්වීමෙන් පසුවද එසේ කිරීමට ඔහු අසමත් වූවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව, කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයකුගේ නමක් සමග නම් ඇතුලත් වී ඇති කිසිවකු සමග තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධවන කවරකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කල යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර් කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත් කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ, එම තනතුර දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. ගාළු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1964 අප්‍රේල් මස 7 වැනි දින ප.ව. 3 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන් ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට උවමනානම්, මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කල හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිල ගණන් ටෙන්ඩර් විවෘත කල දින පටන්, මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. යූ. ද' ඇස්. හේවා විසෙන්ති,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන,
ගාලූ දිස්ත්‍රික්කය.

1964.3.18 දින,
ගාල්ලේ ගොවිජන සේවා කාර්යාලයේදීය.

3–1003—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### එතිමෝල් වැව ව්‍යාපාරයෙහි පොදු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ටෙන්ඩර්

කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ ඉඩම් වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ එතිමෝල් වැව ව්‍යාපාරයේ ඇඳන් 12 කට ඉඩ කඩ ඇති ප්‍රසූතිකාගාරයක් හා ශිෂ්‍යයින් 200 ට ඉඩ ඇති පාසැලක් හා ගුරු නිවාසයක් හා උපගුරු නිවාස 2 ක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් 1964.4.21 වැනි දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්ම වල අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. එක් විෂයකට හෝ සියල්ලටම ටෙන්ඩර් කල හැක.

3. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් අයුරින් ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1964.4.17 දින දවල් 12 තෙක් පෝර්ම නිකුත් කරනු ලැබේ.

(අ) එක් විෂයකට ටෙන්ඩර් කිරීමට රු. 15,000 ට ලියාපදිංචි වීම.

(ආ) **සියළු** විෂයන්ට ටෙන්ඩර් කිරීමට රු. 50,000 ලියා පදිංචි වීම.

4. මෙම කාර්යාලයේ හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සිය පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරන විට ලියා පදිංචිය ඔප්පු කිරීම් වස් ලේඛන ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ අංක 355 දරණ කාමරයෙහිදී 1964.4.21 දින පෙ. ව. 10 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේ දී පෙනී සිටිය හැක.

6. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විමසන්න.

සී. ද. පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

1964.3.20 දින,
ඉ. සං. දෙ. කාර්යාලයේ දීය,
කොළඹ 1.

3–1031—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක විසින් ඩොජ්, ඔස්ටින්, බෙඩ්පෝර්ඩ්, මොරිස් කොමාර්ෂල්, ජී. ඇම්. සී., විලීස් හා පෝර්ඩ් යන වාහන වර්ගයන්ට අයත් ඇන්ජින් 30 ක් (කොටස් වශයෙන්) සඳහා 1964 අප්‍රේල් මස 10 වෙනි දින පෙ. ව. 11 තෙක් ටෙන්ඩර් අයදුම්පත්‍ර භාර ගනු ලැබේ. යථෝක්ත වාහන කොටස් කොළඹ 6, කිරිල්ලපොන, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මධ්‍යම කර්මාන්තශාලාවේ දී පරීක්ෂා කර බැලිය හැක.

1964 අප්‍රේල් මස 9 වෙනි දින දවල් 12 වන තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, කොළඹ 1 යන ස්ථානයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පත්‍රයන් පිළියෙල කොට පිටපත් දෙකකින් යුක්ත විය යුතුයි. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙහි හෝ යෝර්ක් වීදියේ, ලංකා බැංකුවේ, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක ගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රුපියල් 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුවේ.

ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ මුද්‍රා තබා, එහි උඩ වම් කෙලවරේ "සේවයට අයෝග්‍යය ඇන්ජින් කොටස් මිලදී ගැණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි. එසේ සඳහන් කළ ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැන වෙත, එම කවරයේ වම්පස පහත කොටසෙහි ටෙන්ඩර් කරුගේ ලිපිනය ද සඳහන් කොට ලියා පදිංචි තැපෑලෙන් හෝ තමා විසින් ගෙනැවිත් දීමෙන් හෝ එසේ නැත්නම් තමාගේ නියෝජිතයෙකු ගේ මාර්ගයෙන් හෝ ගණකාධිකාරී තැනට භාරදී, ලැබුන බව හැගවීමේ කුවිතාන්සියක් ලබා ගත යුතුයි. නැතහොත් ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාමරයෙහි වූ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

1964 අප්‍රේල් මස 10 වෙනි දින, පෙරවරු 11 ට කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී යථෝක්ත ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවෙහි, කැමති ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

මේ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන්නට අදහස් කරන ටෙන්ඩර් කරුවන්ට ඉල්ලුම් කිරීමට මත්තෙන්, කොටස් වශයෙන් ඇති එම යන්ත්‍ර, කොළඹ 6 කිරිල්ලපොන, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මධ්‍යම කර්මාන්තශාලාවේදී පරීක්ෂා කළ හැක. ටෙන්ඩරයේ ඇතිවන සියළුම වෙනස් කිරීම හා මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කළ යුතුයි.

සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින්, තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බව දැන් වූ විට ටෙන්ඩර් කරනු ලැබූ මුදල සම්පූර්ණයෙන්ම දින 10 ක් ඇතුලත දී ගෙවිය යුතුයි. අස්කර ගැනීම සඳහා තමන් විසින් වැඩ පිළිවෙලක් යොදා ගත යුතුයි. නියමිත කාලය තුලදී, අස්කර ගනු නොලබන සියළුම ඇන්ජින් කොටස් ආදිය නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත් කරනු ලැබේ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අනුදැනුම ඇතිව විනා අන් කිසි අයුරකින් ඇන්ජින් සඳහා ඉදිරිපත් වීමට කිසිදු අයිතිවාසිකමක් නැත. යම් හෙයකින් සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව පැහැර හරිනු ලැබුවොත්, ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනය ට ද ඔහුගේ නම ඇතුළත් වනවා ඇත.

කැමති කොටස් ගණනකට හෝ එසේ නැතහොත් සියල්ලටම හෝ ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අතර, ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම රජය සතු වන්නේ ය.

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කායාශීලය,
එවිලන් චතුරශ්‍රය, කොළඹ 1,
1964.3.21.

3–1032—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

ඞ

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### වාණේ කාප්ප සැපයීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් ශීර්ෂය යටතේ 1964.3.6 දින රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ වූ ගැසට් දැන්වීම ගැනයි. අවශ්‍ය කාප්ප ප්‍රමාණය පහත දක්වෙන අයුරු වෙනස් කළ බැව් දන්වනු ලැබේ :—

(1) අඩි 36ක් පරතරය ඇති කාප්ප 72.

(2) අඩි 26½ක් පරතරය ඇති කාප්ප 20.

(3) අඩි 24ක් පරතරය ඇති කාප්ප 24.

2. 1964.4.2 දින දහවල් 12.00 තෙක් ටෙන්ඩර් පෝරම නිකුත්කිරීම දීර්ඝ කරන ලදී. 1964.4.3 දින පෙරවරු 11.00 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. පෙ. ව. 11.15ට ටෙන්ඩර් විවෘතකරනු ලැබේ.

සී. විස්වාසම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එවලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1964.3.21.

3–1033—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### වැල්ලවායේ රක්ෂා නොමැති ළමයින්ගේ පාසැලට විදුලි ස්ථාපනය සඳහා ටෙන්ඩර්

13.3.64 වන දින අංක 13,986 දරන රජයේ ගැසට් පතෙහි ඉහත සඳහන් ශීර්ෂය යටතේ පලවූ 7.3.64 දින දරන නිවේදනය මෙයින් අවලංගු කරමි.

සී. විස්වාසම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇවලන් චතුරශ්‍රය,
කොළඹ, 21.3.64.

3-1030—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## රෙදි සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

කාකි ඩ්‍රිල් යාර 2,100 ක් සහ නිල් ඩ්‍රිල් යාර 150ක් සැපයීම සඳහා මිළ ගණන් ම විසින් බාරගනු ලැබේ. මිළ ගණන් සමග සාම්පල් රෙදි කෑලි එවිය යුතුය.

මිළ ගණන් කවරවල බහා පිට පැත්තේ වම් කෙළවරේ "රෙදිවලට මිළ ගණන්" යි ලියා කොළඹ 5, නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ සභාපතිට 1964 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පස්වරු 2 ට පෙර ලැබෙනසේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

වැඩි විස්තර මේ කාර්‍යාලයේ මාණ්ඩලික සහකාරගෙන් ලබාගත හැක.

ඇම්. බී. සල්මන්,
සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
කොළඹ 5,
1964.3.20.

3–986—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1964 අප්‍රේල් 1 වැනි දින සිට 1964 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා, ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කොළඹ හැර, අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු බස්නාහිර පළාතේ ආයතනයන් සඳහා මෙම කාර්යාලයෙන් ද අනික් පළාත්වල ආයතනයන් සඳහා ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක, "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලය, ගාලු මුවදෙර, කොළඹ." කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහනලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙලකර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපසෙ දක්ව ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැතිකිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක් ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකි ය.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය අධ්‍යක්ෂක වෙනුවට.

1964.3.20 වෙනි දින,
කොළඹ ගාලුමුවදෙර මහලේකම් කාර්යාලය යාබද
"බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල් අංශයේ දීය.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍යය | (6) ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| නුවර මහ රෝහල | | | | | |
| 3 වෙනි කොටස — | රුපියල් | රුපියල් | | | |
| වාට්ටු අංක 8 සහ 9, 17 සහ 18 (මාතෘ වාට්ටු) ... | 50 ... | 100 ... | 30 ... | 5,300 ... | 1964.4.15 වැනි දින පෙ.ව. 10ට |

3–955—64.3.26 දින අංක 13,993 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : එජ්ටීබී/53/63

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ඉතිලීන් ඩයමීන් අඩංගු තියෝපිලීන් ආදිය සැපයීම

මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට ඉතිලීන් ඩයමීන් අඩංගු තියෝපිලීන් සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 ජූනි 30වෙනි අඟහරුවාද උදේ 10 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ගාලු මුවදොර පිහිටි මහ ලේකම් ගොඩනැගිල්ලේ " බී " අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි 6 වැනි ඡෙද යන්හි සඳහන් කරුණු අනුව 1964 ජූනි 29 වෙනි සඳුදා උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමු වෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ " ඉතිලීන් ඩයමීන් අඩංගු තියෝපිලීන් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් 1964.6.30 උදේ 10ට " යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ, කාමර අංක 155හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍ය යයි හැඟේ නම්, සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් භාරදීම ද කළ හැක. එසේ භාර දෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහා ද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර් පත් භාර ගැනීම සඳහා ඉහත කී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ටෙන්ඩර් පත් භාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්ත වරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුව ද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්ත වරයෙකු බව සහතික කළ යුතු වේ. (මෙ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ.)

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් ඇති, බලය ලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවෙකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර, ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ඇත්තන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිත කළ හැක්කේ **ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.**

8. මෙහි පළමු වැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකයින් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්ත වරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයන්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්තානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

9. වෙනත් අවශ්‍ය විස්තර මොණරාගල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් සම්බන්ධයෙන් අදාළ ලියකියවිලි මෙහිදී පරීක්‍ෂා කර බැලිය හැකිය.

10. වැඩය භාර ගන්නා කොන්ත්‍රාත්කරු විසින්, සේවයේ යොදවනු ලබන සියලුම සේවකයින් ලාංකිකයින් විය යුතුය. එසේම මේ සඳහා යොදවන සේවකයින් එකී වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම සොයා ගැනීමට කොන්ත්‍රාත්කරු විසින් සෑම උත්සාහයක්ම දැරිය යුතුයි. ලාංකිකවූද, වැඩය කෙරෙන ප්‍රදෙශයෙන්ම සොයා ගනු ලැබුවාවූද සේවකයින් වැඩයෙහි යෙදවීම; කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වශයෙන් සලකන අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන සමග අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයා සාකච්ඡාකර අවසර දෙනු ලබන අවස්ථාවන්හිදී හැර, අන් සෑම විටෙක දීම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකිරීමක් සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටද හේතුවනවා ඇත. එවැනි අනුමතියක් හෝ අවසරයක් හෝ නොමැතිව ලාංකික නොවූද, වැඩය කෙරෙන ප්‍රදේශයේ නොවන්නාවූද සේවකයින් වැඩයෙහි යෙදවීම තහනම්ය.

11. අනුමත කරන ලද තත්ත්වයේ උලු නැතැයි පාඨශාලා ගොඩනැගිලි පරීක්‍ෂක තැන සහතික කළහොත් මිස, මෙරට නිපදවන උලුම පාවිච්චි කළ යුතුයි. මේවායේ තත්ත්වය පරීක්‍ෂා කිරීමට අවශ්‍ය වුවහොත්, ඒ පිළිබඳ පරීක්‍ෂණ ලංකාවේ රසායනික සහ කාර්මික පර්යේෂණායතනය මගින් පවත්වනු ඇත. ඒ සඳහා යන වියදම් සපයන්නා විසින් දැරිය යුතුයි.

ඉ. ග. පියරත්න,
මොණරාගල අධ්‍යාපන නිලධාරි තැන.

1964 මාර්තු මස 18 වැනි දින,
මොණරාගල,
අධ්‍යාපන කාර්යාලයේදීය.

3–1017/2—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 වූ අප්‍රේල් මස 17 වැනි සිකුරාද පස්වරු 2.30 වනතෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| 1. මහ/උඩුවෙල ම. වි. | ... | පාසැල් ගොඩනැගිලි තැනීම |
| 2. මහ/ගොඩමුන්න සි. මි. පා. | ... | එම |
| 3. මහ/ගිනිගත්හේන ම. ම. වි. | ... | එම |
| 4. මහ/පල්කුඹුර මුස්ලිම් පාසැල | ... | එම |
| 5. මහ/කඩුගන්නාව ම. වි. | ... | එම |
| 6. මහ/ශ්‍රීපාද විද්‍යාලය | ... | එම |
| 7. මහ/රාහුල විද්‍යාලය | ... | පාසල් ගොඩනැගිල්ල නැවත සෑදීම |
| 8. මහ/ශ්‍රීපාද විද්‍යාලය | ... | රසායනාගාරය තැනීම |
| 9. මහ/මයිලපිටිය ම. වි. | ... | එම |
| 10. මහ/කලුකැලේ බාලිකා | ... | පාසැල් ගොඩනැගිලි තැනීම ආදිය |
| 11. මහ/කලුකැලේ මුස්ලිම් | ... | එම |
| 12. මහ/උඩෝවිට සි. මි. පා. | ... | එම |
| 13. මහ/කන්දේගම සි. මි. පා. | ... | එම |
| 14. මහ/පූලියද්ද සි. මි. පා. | ... | එම |
| 15. මහ/තවන්එළිය සි. මි. පා. | ... | එම |

**සංලක්‍ෂාය :** අංක 1 මහ = මහනුවර

අංක 2 අවශ්‍ය ලියාපදිංචි කිරීම

| | අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව | | | අනුමත කළ සමිති සමාගම් | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| අංක 1 සිට ... | 40,000 | 0 | ... | 40,000 | 0 |
| අංක 2 සිට 6 ... | 30,000 | 0 | ... | 30,000 | 0 |
| අංක 7 සිට 11 ... | 25,000 | 0 | ... | 25,000 | 0 |
| අංක 12 සිට 15 ... | 20,000 | 0 | ... | 20,000 | 0 |

(2) ඉහත දක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එහි සඳහන් මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් මස 16 වැනි බ්‍රහස්පතින්ද දින දවල් 12. වන තෙක් නිකුත් කරනු ලැබේ.

(3) ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ කාර්යාලයේ ජී. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක්ද තැන්පත්කොට ලබාගත් කුවිතාන්සි මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කිරීමෙන් පසුව ය. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

(4) ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂතැනගෙන් ලබාගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ වවුචර් නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡේදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අපට පමණකි.

(5) ඉහත සඳහන් 2 වෙනි ඡේදයන්හි දක්වෙන පරිදි මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂකතැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමඟය. සියලුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂකතැනගෙන් දැනගත හැකි යි. සැලැස්ම ද එහිදී බලාගත හැකි ය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නො එවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රාතබන ලද ටෙන්ඩර් කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර නිලධාරිතැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය ද, තමන් ඉල්ලා ඇති වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

(6) වර්ෂ 1964 අප්‍රේල් මස 17 වැනි සිකුරාද පස්වරු 2.30 ට කොළඹ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණය ද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

(7) ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6 කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

(8) වෙනත් අවශ්‍ය විස්තර මහනුවර මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහි දී පරීක්ෂාකර බැලිය හැක.

(9) වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයන් වියයුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නො පිළිපැදීම කොන්ත්‍රාක්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම් ය.

යූ. ඩී. අයි. සිරිසේන,
මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

වර්ෂ 1964 ක්වූ මාර්තු මස 20 දින,
මහනුවර, අධ්‍යාපන කාර්යාලයේදී ය.

3–1036/1—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 වූ අප්‍රියෙල් මස 17 වැනි සිකුරාද පෙරවරු 10.30 වනතෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මහනුවර, උප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| 1. මහ/රාහුල විද්‍යාලය | ... | අලුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම |
| 2. මහ/තැන්නෙලන්ද සි. මි. පා.. | ... | පාසැල් ගොඩනැගිලි තැනීම |
| 3. මහ/රාහුල විද්‍යාලය | ... | එම |
| 4. මහ/නාරන්විට සි. මි. පා. | ... | එම |
| 5. මහ/උඩහේන්තැන්න සි. මි. පා. | ... | එම |
| 6. මහ/හෙබ්බෙකන්ද සි. මි. පා. | ... | වීදුරු දැමීම ආදිය |
| 7. මහ/ගිනිගත්හේන ම. ම. වි. | ... | වහල ප්‍රතිසංස්කරණය කිරීම |
| 8. මහ/පේරාදෙනිය අ. වි. | ... | අලුත්වැඩියා කිරීම |
| 9. මහ/දෙකින්ද සි. මි. පා. | ... | වීදුරු දැමීම ආදිය |
| 10. මහ/හේවාවිස්ස සි. මි. පා. | ... | කන්තෝරු කාමර සහ ගබඩා කාමරය තැනීම |

සංලක්ෂාය :— අංක 1 : මහ = මහනුවර

අංක 2 : අවශ්‍ය ලියාපදිංචි කිරීම

| | | අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව | | | අනුමතකළ සමිති සමාගම් | |
|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | රු. | ශ. |
| අංක 1 සිට 5 | ... | 15,000 | 0 | ... | 15,000 | 0 |
| අංක 6 සිට 8 | ... | 10,000 | 0 | ... | 10,000 | 0 |
| අංක 9 සිට 10 | ... | 5,000 | 0 | ... | 5,000 | 0 |

ඉහත දක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එහි සඳහන් මුදලකට නො අඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රියෙල් මස 16 වැනි බ්‍රහස්පතින්ද දින දවල් 12.00 වන තෙක් නිකුත් කරනු ලැබේ.

(3) ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ජී. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක්ද තැන්පත්කොට ලබාගත් කුවිතාන්සි, මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කිරීමෙන් පසුව ය. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

(4) ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂතැනගෙන් ලබාගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ වවුචර් නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡෙදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

(5) ඉහත සඳහන් 2 වෙනි ඡෙදයන්හි දක්වෙන පරිදි මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂතැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂතැනගෙන් දැනගත හැකි යි. සැලැස්ම් ද එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නො එවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරිතැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද, තමන් ඉල්ලා ඇති වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

(6) වර්ෂ 1964 අප්‍රියෙල් මස 17 වැනි සිකුරාද පස්වරු 2.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නම ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

(7) ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6 කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

(8) වෙනත් අවශ්‍ය විස්තර මහනුවර මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැක.

(9) වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයන් වියයුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නො පිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

යූ. ඩී. අයි. සිරිසේන,
මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

වර්ෂ 1964 ක්වූ මාර්තු මස 20 දින,
මහනුවර, අධ්‍යාපන කාර්යාලයේදීය.

3–1036/2—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

මෙරටින් සිල්පර කොට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : මහා ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, කොළඹ 1) 1964 අප්‍රේල් මස 29 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් භාර ගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරීතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1964 අප්‍රේල් මස 25 වැනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1964 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 ට ප්‍රවාහණ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1964 මාර්තු මස 20 වැනි දින,
තැ. පෙ. 1347—කොළඹ.

3–1041—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## මුද්‍රණ ලෝහ මණ්ඩි (Lead Dross) මිළයට ගැනීම සහ ඉවත් කරගැනීම

ආණ්ඩුවේ මුද්‍රණාලයේ දළ වශයෙන් ටොන් 7ක් පමණ ඇති මුද්‍රණ ලෝහ මණ්ඩි මිළයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා මුද්‍රා තබා රෙජිස්ටර් තැපැලෙන් එවනු ලබන ටෙන්ඩර්, කොළඹ, බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් 1964 අප්‍රේල් 15 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් බහාලූ මුද්‍රා කරන ලද කවරයේ වම් කෙළවරේ උඩ " මුද්‍රණ ලෝහ මණ්ඩි මිළයට ගැනීම සහ ඉවත් කර ගැනීම " යන්න ලියා තිබිය යුතුය. රෙජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර් ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයේ ඒ සඳහා තබා ඇති පෙට්ටියට බහාලිය යුතුය.

2. බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයෙන් භාරගන්නා ටොන් එකක මිළ වශයෙන් සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

4. 1964 අප්‍රේල් 14 වැනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ලෝහවල ආදර්ශයන් සෙනසුරාදා දිනයන් හැර සතියේ කවර දිනක හෝ පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා මෙම දෙපාර්තමේන්තුවේ දී බැලිය හැක.

6. වැඩිම මිළ ගණන සඳහන් වන ටෙන්ඩරය භාරගැනීමේ අයිතිය ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිතුමා සතුවනවා ඇත.

7. ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් 15 වැනි දින පෙරවරු 9.30ට කොළඹ බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයේදී විවෘත කරන විට, ටෙන්ඩර්පත්‍රකරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ඇත.

8. නොපිළිගන්නා ටෙන්ඩර් පත්‍රවල තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

9. ටෙන්ඩරය පිළිගත් බව දන්වූ දින සිට දින හතක් ඇතුළතදී මුළු මුදල ගෙවා ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල කිසිම හිමිකමක් නොලැබෙන පරිදි රාජසන්තක කරනු ඇත.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 මාර්තු 23 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

3–1079—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### මඩකලපු දිස්ත්‍රික්කයේ කට්ටන්කුඩිහි ධීවර නිවාස 12ක් සෑදීම

මඩකලපු දිස්ත්‍රික්කයේ කට්ටන්කුඩිහි ධීවර නිවාස 12ක් සෑදීම සඳහා ටෙන්ඩර් 1964 අප්‍රේල් මස 22 වෙනි බදාදා දවල් 12 වනතුරු කොළඹ, ගාලු මුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් භාර ගන්නවා ඇත.

කොළඹ, ගාලු මුවදොර, ධීවර අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තව, ටෙන්ඩර් එවිය යුතුයි. රු. 50,000 කට හෝ ඊට වඩා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ ලියාපදිංචි වූ තැනැත්තන්ට පමණක් 1964 අප්‍රේල් මස 20 වෙනිදා පස්වරු 3 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් කරුවන් විසින් කොළඹ, ගාලු මුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී රුපියල් 100ක් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී එසේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර ධීවර අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැක.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

1964 මාර්තු මස 18 වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

3–834—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පේසාලේ අයිස් කර්මාන්තශාලාවට ඉලෙක්ට්‍රික් මෝටරයක් සැපයීම, සවිකිරීම සහ එහි සවිකර ඇති තෙල් ඇන්ජිම ගැලවීම

1964 අප්‍රියෙල් මස 24 වැනි සිකුරාදා පස්වරු 2 දක්වා කොළඹ 3, ගාලු මුවදොර, ධීවර අධ්‍යක්ෂ තැන විසින් පේසාලේ ධීවර දෙපාර්තමේන්තුවේ අයිස් කර්මාන්තශාලාවට ඉලෙක්ට්‍රික් මෝටරයක් සැපයීම, සවිකිරීම සහ එහි සවිකර ඇති තෙල් ඇන්ජින් එක ගැලවීමට ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 250යි.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

1964 මාර්තු මස 17 වැනිදා,
කොළඹ, ගාලුමුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

3–898—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### වේලපු මෝර වරල් ගැනීම

1964 අප්‍රියෙල් මස 17 වැනි දින පස්වරු 2 දක්වා කොළඹ 3, ගාළු මුවදොර, ධීවර අධ්‍යක්ෂක විසින් වේලපු මෝර වරල් ගැනීම සඳහා ඔහුගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 50 යි.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

1964 මාර්තු මස 17 වැනිදා,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

3–902—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## ගාලු කච්චේරිය

### ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරළයේ නැගෙනහිර පිටිගල ජනපද පාරේ පළමුවන සැතැප්ම ගල් අතුරා තාර දැමීම

ඉහත සඳහන් පාර තැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 අප්‍රේල් 10 වෙනි දින පස්වරු 2.30 වන තෙක් ගාල්ලේ දිසාපති තුමා විසින් භාරගනු ලැබේ. එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැක. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය, ගාලු දිසාපති කාර්යාලයයේ ඉඩම් අංශයේ තබනු ඇත.

2. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ, ගාල්ලේ දිසාපති තුමා වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩය පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයයේදී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර හා තොරතුරුද ඔහු වෙතින් ලබාගත හැක.

3. රජය විසින් පිළිගත් රුපියල් 30,000ට නොඅඩු වැඩ සඳහා ලියාපදිංචි ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් කිරීමට සුදුසුකම් ලබා ඇති අතර, ඔවුන් විසින් ඒ වෙනුවෙන් 1964 අප්‍රේල් මස 8 වෙනි දින දවල් 12ට ටෙන්ඩර් පත්‍රිකා නිකුත්කර අවසන් කිරීමට පෙර ඉහත සඳහන් දිසාපතිතුමා වෙත (අ) එසේ ලියාපදිංචි වී තිබීම පිළිබඳ සාධකත් (ආ) රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහාවූ කුවිතාන්සියත් ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයයේදී හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයක දී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේදී හෝ ගෙවීමට පුළුවන.

එල්. අයි. ජේ. සිල්වා,
උප දිසාපති,
ගාලු දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1964 මාර්තු මස 18 දින,
ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දී ය.

3–987—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

වර්ෂ 1963-64 රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ ගොඩනැගිලි ("අ" කොටස) නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා එවන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ සබරගමු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රියෙල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් භාරගනු ලැබේ.

2. රත්නපුර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර පුරවා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය. මේ සම්බන්ධව සියළුම විස්තර ඔහුගෙන් ලබාගත හැක.

3. වර්ෂ 1964 අප්‍රියෙල් මස 10 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 28,000ට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්තුකරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල්, කොළඹ කොටුවේ පිහිටි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

කේ. තුරෙයිසිංහම්,
සබරගමු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන.

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
රත්නපුර, 64.3 19.

**3–942—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය**

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කාර්මික ප්‍රදර්ශනයට ඉබේ තෙල් දමෙන පීඩන වතුර පොම්ප කට්ටල 5 ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 මැයි මස 6 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ. අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේ දී 1964 මැයි මස 7 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ටැන්ඩර් විවෘතකරන විට ටැන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

2. කොළඹ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගබඩා අංශයේ දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර රජයේ වැඩ අධ්‍යක්ෂගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන : නිදර්ශන.—චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති රෙජිස්ත්‍රාර් තැන විසින් ලියාපදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 මැයි මස 5 වැනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. " ලාංකික කරන ලද මූලාශ්‍ර වලින් " එනම්, ජපානය, ජර්මනිය, චීනය, ඇල්මේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ඇස්තෝනියාව, හංගේරියාව, ලැට්වියාව, ලිතුඇනියාව, පෝලන්තය රුමේනියාව, ස්පාඤ්ඤය, සෝවියට් සමාජ වාදී එක්සත් සමූහාණ්ඩුව සහ යුගෝස්ලේවියා ආදී රටවලින් බඩු ගෙන්වා සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද පොදු ආනයන බල පත්‍රයක් ඇති ලියාපදිංචි කළ ලාංකික වෙළඳුන් විය යුතුය.

වී. අරසරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1964.3.18,
රජයේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ 1.

3–977—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

රත්නපුර දිස්ත්‍රික්කයේ සිල් ආලේප වැඩ සහ නැවත මතුපිට සකස් කිරීමට අඟල් 1/2 ගල් කියුබ් 10ක් සහ අඟල් 3/4 ගල් කියුබ් 220 ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 අප්‍රේල් මස 29 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ. 1964 අප්‍රේල් මස 30 වැනි දින පෙරවරු 10 ට අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේ දී ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

2. රත්නපුර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගේ කායසීලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 තැන්පත් කර ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කර විධායක ඉංජිනේරු ගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන : නිදර්ශන.—චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති රෙජිස්ත්‍රාර් තැන විසින් ලියාපදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත් ලාංකිකයන්ටද සහ ලාංකික වෙළඳ සමාගම් වලට සීමාකර තිබේ.

වී. අරසරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1964.3.18,
රජයේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ 1.

3–980—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

අංකය : ඇප්.ටී.සී. 23/63.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් ප්‍රතිඵල

ටොලසේ ලයින් හයිඩොක්ලොරයිඩ් බී.පී. ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්
ටෙන්ඩර් අවසාන දිනය : 1963. 10. 22 දින
අංක 13,731 හා 63. 8. 16 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය බලන්න.

| විෂය අංකය | විස්තරය | කෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිල ගණන් |
|---|---|---|---|
| 1. | ටොලාසෝලයින් හයිඩොක්ලොරයිඩ් බී.පී.මි.ග්‍රෑ. 25 පෙති 300,000 | කෙමපාලේ පොරින් ඩරේඩ් කෝපරේෂන් චෙකොස්ලොවෙකියාව | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සමග පෙති 1,000ක් රුපියල් 3.55ය. |
| 2. | ඇසිඩ් ආකොබික් ඉන්ජැක්සන් (විටැමින් සී) ඇම්පියුල්ස් 150,000 මිලිමීස් 1ක මි.ග්‍රෑ. 100කි. රතුපාට ඇම්පියුල්ස් නහරගත කිරීමට සහ මසට විදීමට සුදුසු සහ ඒ අනුව ලේබන කරන ලද. | සීමාසහිත දොරෙයි අරුල් සහ සමාගම, කොළඹ | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සමග ඈම්.පී. 50ක් පවු. 0, සි. 2, පැ. 5යි |
| 3. | ඩියඩෝහයිඩොක්සි කුවිනෝලයින් බී.පී. ග්‍රෑම් 0.3 ප්‍රමාණයේ පෙති 1,500,000 | පන්ජාබ් ඩ්‍රග් හවුස් සමාගම, පකිස්තානය ... | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සමග පෙති 500ක් පකිස්. රුපියල් 4.84 |
| 4. | පෙනිටොයින් සෝඩියම් බී.පී. ග්‍රෙන්ස් 1½ (මි.ග්‍රෑ.100) කැප්සියුල්ස් 2,000,000 | ලැබී තිබුන සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරන ලදී. | — |
| 5. | නියෝමයිසීන් සල්ජේට් බී.ජී. ග්‍රෑම් 0.5 පෙති 12,000ක් ... | ලැබෝර්ටරීස් සෝබියෝ සමාගම, ප්‍රංශය ... | පෙති 500ක් රු. 76.30යි |
| 6. | ඩයිතිල් කාබමයිසීන් සිට්‍රෙට් බී.පී. මිලිග්‍රෑමස් 50හේ පෙති 16,000,000 | සීමාසහිත ජේ. ඇල්. මොරිසන් පුත්‍ර සහ ජොන්ස් (ලංකා) සමාගම, කොළඹ | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සහිත පෙති 1,000 ප.0, සි.8, පැ1කි. |
| 7. | මෙට්‍රොනියිඩසෝල්, මිලිග්‍රෑම් 200, පෙති 100,000 ... | ලැබෝර්ටරීස් ඇට්රාල් ඇස්. ඒ. ආර්. ඇල් ප්‍රෘතුගාලය | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සමග පෙති 250ක් ප.3, සි.11, පැ.2කි. |

II. ලැබී තිබුන ටෙන්ඩර් පත් සංඛ්‍යාව 62කි.

ඇස්. ඥණසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 584,
කොළඹ,
1964 මාර්තු 20 දින.

3–956—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඇප්.ටී.සී. 22/63

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් ප්‍රතිඵල

හැලෝතීන් බී. පී. ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්—ටෙන්ඩර් අවසාන වූ දිනය 1963.11.19 අංක 13,731 හා 63.8.16 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය බලන්න.

| විෂය අංකය | වර්ගය | කෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන් |
|---|---|---|---|
| 1. | හැලෝතීන් බී. පී. (ඇඩෙන්ඩම් 1960) සිහිනැති කිරීමේ කටයුතු සඳහා බෝතල් 1000 × සීසී 250 | සීමාසහිත අයි. සී. අයි. සමාගම, එක්සත් රාජධානිය | රා/නියෝජිතයින්ගේ ගාස්තු ඇතුළුව සම්පූර්ණ තොගය ප. 8,945 යි, සි. 0, පැ. 0 සී. |
| 2. | හයිඩ්‍රෝක්ලොරයිඩ් හෙමිසසිනේට් සෝඩියම් ඉන්ජැක්සන් වයල් එකක හයිඩ්‍රොකෝටිසොන් මිලි ග්‍රෑම් 100 ක් අඩංගුය. නහරගත කිරීම සඳහා සුදුසු රබර් මූඩි ගසන ලද වයල්ස් 10,000 | ලැබුණ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරණ ලදී. | |
| 3. | ටෙට්‍රාසිකලින් හයිඩොක්ලොරයිඩ් ඉන්ජැක්සන් බී. පී. මි. ග්‍රෑ. 100 මසට විදීම සඳහා ඒ අනුව ලේබල් කරන ලද වයල්ස් 5,000 යි | ලැබෝර්ටරීස් ඇට්රාල් සමාගම්, ඇස්. ඒ. ආර්. ඇල්. ප්‍රෘතුගාලය | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සහිතව වයල්ස් 100 ක් ප. 2, සි. 7, පැ. 6 කි. |
| 4. | ටෙට්‍රාසික්ලීන් හයිඩක්ලොරයිඩ් බී. පී. ඉන්ජැක්ෂන් මි. ග්‍රෑ. 250 ප්‍රමාණයේ නහරගත කිරීම සඳහා ඒ අනුව ලේබල් කරන ලද වයල්ස් 2,000 යි | ලැබෝර්ටරීස් ඇට්රාල් සමාගම, ඇස්. ඒ. ආර්. ඇල්. පෘතුගාලය | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සමග වයල්ස් 100 ක් ප. 2 යි, සි. 16, පැ. 3 |
| 5. | ඩෙමිතිල් ක්ලොරෝටෙට්‍රාසයික්ලීන් කැප්සියුල්ස් 600,000 යි. එක කැප්සියුලයක් මි. ග්‍රෑ. 150 ප්‍රමාණයේ | සීමාසහිත ඉන්ටනැෂනල් හෝල්ඩින් (පිටියි) සමාගම | රා/නියෝජිතයින්ගේ ගාස්තු ඇතුලුව සම්පූර්ණ තොගය ප. 13,615, සි. 0, පැ. 0. |
| 6. | ක්ලෝරම්පැනිකෝල් බී. පී. කැප්සියුල් 1,200,000 ය. මි. ග්‍රෑ. 250 ප්‍රමාණයේ | ලැබුන සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරණ ලදී. | |
| 7. | ටෙට්‍රාසිකලයින් හයිඩොක්ලාන් රයිඩ් බී. පී. කැප්සියුල්ස් 600,000 මි. ග්‍රෑ. 250 ප්‍රමාණයේ | සීමාසහිත ආර්කෝ සමාගම, සුවිට්සර්ලන්තය | මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තුව සමග කැපිසියුල්ස් 100 ක් ප. 0, සි. 9, පැ. 8 කි. |

(II) ලැබී තිබුණ ටෙන්ඩර් පත් සංඛ්‍යාව 57 කි.

ඇස්. ඥණසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 584,
කොළඹ,
1964 මාර්තු 21.

3–1018—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## දැන්වීමයි

කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශයේ පාවිච්චිකර අබලන් වූ මෙහි පහත නම් සඳහන් ද්‍රව්‍යයන් වර්ෂ 1964ක් වූ අප්‍රියෙල් මස 10 වැනි දින පස්වරු 2ට කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාල යේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ලන්සු තබා බඩු ගන්නා අය එවලේම මුදල් ගෙවා බඩු කාර්යාල යෙන් පිටකර ගත යුතු බව විශේෂයෙන් දන්වමි.

| බඩු ද්‍රව්‍යයේ නම | | | වෙන්දේසි කරන ගණන |
|---|---|---|---|
| 1. ඇඳි පුටු | ... | ... | 2 |
| 2. සාමාන්‍ය පොඩි පුටු | ... | ... | 4 |
| 3. බිත්ති ඔර්ලෝසු | ... | ... | 2 |
| 4. ගුවන් විදුලි යන්ත්‍ර | ... | ... | 1 |
| 5. මේස ඔර්ලෝසු | ... | ... | 1 |
| 6. හිල් විදින (පන්චර්) ඡිද්‍රකරණ | | ... | 1 |
| 7. බිම් කොටන මුල්ලු | ... | ... | 2 |
| 8. මල්පැලවලට වතුර වක්කරන භාජන | | ... | 2 |
| 9. තණකොළ කපන අත් මැෂින් | | ... | 1 |
| 10. වතුර අදින පොම්ප | ... | ... | 2 |
| 11. හාන්සි පුටු | ... | ... | 1 |
| 12. බැටරි (6v) | ... | ... | 2 |
| 13. පාපැදි—කාන්තාවන්ගේ හා සාමාන්‍ය | | ... | 6 |
| 14. මෝටර් රථ ටයර් (700×20) | | ... | 20 |
| 15. මෝටර් රථ ටියුබ් (700×20) | | ... | 10 |
| 16. මෝටර් රථ ටයර් (600×16) | | ... | 2 |
| 17. මෝටර් රථ ටියුබ් (700×15) | | ... | 5 |

වෙනත් සුළු උපකරණ හා බඩු බාහිරාදියද මෙම වෙන්දේසියේ විකිණීමටද ඉඩ ඇත.

ඉහත සඳහන් බඩු බාහිරාදිය කාර්යාල වේලාවන්හිදී බලා ගැනීමට හැකි වන බවද කරුණාවෙන් සලකන්න.

ඇෆ්. සී. ස්පිට්ල්,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කළුතර දකුණ,
1964 මාර්තු 16 වැනි දින දීය.

3–836—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

## බෙදුම් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මාතර දිස්ත්‍රික් උසාවියේදීය

නො. පී/330

1. මිරිස්සේ පදිංචිව සිට නැසීගිය ක්‍රිස්තෝගු බදුගේ ජෝන් සිල්වා

2. ඔහුගේ නීත්‍යානුකූල බලකාරයා වන මිරිස්සේ පදිංචි පී. එච්. ලීතා නෝනා ........................................ පැමිණිලිකරුවෝ

එදිරිව

1. මිරිස්සේ පදිංචි ගලප්පත්තිගේ දවිත් අප්පු සහ තවත් විත්තිකාරයෝ

ඉහත සඳහන් නඩුවෙන් මට ලැබී තිබෙන බලය ප්‍රකාර මෙහි සඳහන් දේපල ප්‍රථම කොට තක්සේරු මිලට උරුමක්කාරයන් අතරේ වෙන්දේසිකර ඔවුන් ඉදිරිපත් නූනොත් එවෙලේම එම ස්ථානයේදී ම මහජනයා අතරේ වර්ෂ 1964 ක්වූ අප්‍රේල් මස 25 වැනි දින උදය 10.30 ට එම ස්ථානයේදී විකුණනු ලැබේ.

එනම් :—දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලයේ මිරිස්ස යන ගමේ පිහිටි පී. ඇම්. පී. අමරසේකර මිනින්දෝරු මහත්මයා විසින් සාදා ඉහත කී නඩුවේ බැඳ තිබෙන නො. 987 දරණ සැලැස්මේ ප්‍රකාර පෙන්නුම් කරන ලද නොම්මර 1 සහ 2 දරණ බෙදා වෙන් කරන ලද "බී" අක්ෂරය දරණ රූඩ් 1යි, පර්චස් 12 ක් විශාල කම් ඇති, උතුරට එම ඉඩමේ "ඒ" අක්ෂරය දරණ කැබැල්ලද, නැගෙනහිරට දන්ගහවත්තද, දකුණට මෙම ඉඩමේ නො 3 සහ නො. 4 දරණ අත් හැරපු බිම් කැබලිද, බස්නාහිරට පාර ද මායිම් වූ පොල් කොරටුව නොහොත් දම්පිට්ටනියෙවත්ත නමැති ඉඩම වේ.

තක්සේරු මිල රු. 4269.00

විකිණීමේදී කියවා දෙන කොන්දේසි පරිදි උරුමක්කාරයින් අතරේ වෙන්දේසි උනිනම් තමන් ගන්නා ලද මුදලින් 1/10 පංගුවත් සමග කොමසාරිස් තැනගේ සියළුම ගාස්තු ගෙවිය යුතුයි. එසේ උරුමක්කාරයින් ඉදිරිපත් නූනොත් මහජනයා අතර වෙන්දේසි කර ඔවුන් විසින් ගෙවිය යුතු 1/4 පංගුවත් සමග කොමසාරිස් තැනගේ ගාස්තුවද එකවිට ගෙවිය යුතුයි. තවද කොන්දේසි ඔප්පු සහතික කිරීමේ මුද්දර ගාස්තුව සහ නීතිඥ තුමාගේ ගාස්තුවද එවලේම ගෙවිය යුතුයි. ඉතුරු මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත උසාවියට ගෙවිය යුතුයි.

මේ සම්බන්ධ වැඩි විස්තර නීතිඥ ඊ. ඇස්. පොන්සේකා මහත්මයාගෙන් හෝ මගෙන් විමසනු.

මෙයට,

ඇස්. කේ. ජාන් ද සිල්වා,
උසාවියේ කොමසාරිස් තැන සහ ප්‍රසිද්ධ වෙන්දේසිකාර තැන.

1. 3. 1964,
ගින්තාටිය පන්සල ඉදිරිපිට,
ගින්තාටිය, මාතර.

3–159—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නිස් නිවාස සඳහා ඉල්ලුම් පත්‍ර—දඹුල්ල නිවාස යෝජනා ක්‍රමය

දඹුල්ලේ සාදා ඇති කුලියට සින්නාවීමේ ක්‍රමයට දිය හැකි දැනට හිස්ව ඇති අඩුකුලී නිවාස සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාව/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රු. 300 කට නොවැඩි අය ;

(ආ) තමන්ගේ හෝ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ හෝ තමන්ගේ යැපෙන ළමයකුගේ නමින් හෝ ගෙයක් නොමැති අය ;

(ඇ) නිවාස යෝජනා ක්‍රමයේ සිට සැ. 5ක අර්ධ විෂ්කම්භයක් ඇතුළත පිහිටි ගම්මුලාදැනි වසම තුළ අවුරුදු දහයකට නො අඩු කාලයක් ස්ථිර පදිංචියක් ඇති හෝ ස්ථිර අයිතිවාසිකම් ඇති අය.

2. සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 15 ක් පමණ වූ ඉඩමකය. ගෙවල්වල වහළ උළු සෙවිලි කර ඇති අතර, බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගෙයකට ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්රිත වැසිකිළියක් බැගින් තිබේ.

3. ගෙයක කුළිය මසකට රු. 30 ක් වේ.

4. ගෙයි පදිංචිකරුට ගෙයි නීත්‍යානුකූලව අයිතිය පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී, ශේෂව තිබෙන මුදල එකවිටම ගෙවා දැමීමත් සමගම ගෙයි නීත්‍යානුකූල අයිතියක් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියදා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද, වරිපනම් හා වෙනත් ගාස්තුද ගෙවිය යුතුයි.

5. ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරාගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසිනි.

6. ඉල්ලුම් පත් පිළියෙල කළ යුත්තේ මහනුවර ජාතික නිවාස සහකාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ දඹුල්ල ගම්කාර්ය සභා කාර්යාල යෙන් නොමිළයේ ලබා ගත හැකි විශේෂ ආකෘති පත්‍රවලය.

7. පිළියෙල කරන ලද ඉල්ලුම් පත් ජාතික නිවාස සහකාර කොම සාරිස් තැන වෙත පහත සඳහන් ලිපිනයට 64.4.10 දිනට පෙර ලැබෙන සේ යැවිය යුතුය :—

සහකාර ජාතික නිවාස කොමසාරිස්,
මධ්‍යම වෙළෙඳ හල,
මහනුවර.

8. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දින සිට දින 21 ක් ගතවූවිට එය ලැබුණ බවට දැන්වීමක් නොලැබුණහොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයේ ලියා පදිංචිකරණ ලද ලිපියකින් මහනුවර සහකාර කොම සාරිස් තැනට දන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවර යේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "දඹුල්ලේ නිවාස සඳහා ඉල්ලුම් පත්" යයි සඳහන් කළ යුතුය.

ඞී. ඞී. ඊ. ඒ. ද පොන්සේකා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ 2.

3–12—64.3.26 දින අංක 13,996 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ... ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි